# පශ්චාත් නූතන කතිකාව තුළ බලයේ සහ දැනුමේ ස්ථානගතකරණය: මිචෙල් ෆූකෝගේ න්‍යායාත්මක සාකච්ඡා ඇසුරිනි

**දිනුෂිකා යාපා අබේවර්ධන**

## හැඳින්වීම

සමාජ න්‍යාය තුළ වැදගත් බුද්ධිමය දායකත්වයක් ලබාදෙන පශ්චාත් නූතන සමාජ න්‍යායධාරීන් සහ පශ්චාත් ව්‍යුහවාදීන් විසින් පවතින සමාජ න්‍යායයන් නැවත සලකා බැලීමටත්, අන්තර් විෂයීක මානයකින් ඒවා විශ්ලේෂණය කිරීමටත් උත්සුක වී තිබෙන බව කැපී පෙනෙන කාරණයකි. ඒ අනුව, සමාජ න්‍යාය තුළ බහුල ව සාකච්ඡාවට බඳුන් වන්නා වූ ඉතා සුප්‍රකට, විවාදාත්මක න්‍යාය, සංකල්ප සහ කතිකාවන් ජනනය කිරීමෙහි ලා අතිවිශාල දායකත්වයක් ලබාදුන් න්‍යායධාරියෙක් වශයෙන් මිචෙල් ෆූකෝ (Michel Foucault: 1972-1984) මෑත කාලීන ව ශාස්ත්‍රීය සාකච්ඡාවන්ට එකතු වී ඇත. එක් විෂය ධාරාවකට සීමා කළ නොහැකි, මේ යැයි එකිනෙකින් වෙන් කළ නොහැකි සංකල්ප - මතවාද නිර්මාණය කළ ඔහුගේ බුද්ධිමය ආමන්ත්‍රණ සංකීර්ණ ස්වභාවයක් ගන්නා හෙයින්, දර්ශනය සහ මනෝ විද්‍යාව වැනි විෂය ධාරා සම්බන්ධයෙන් පෘථුල දැනුමක් නොමැත්තෙකු හමුවේ මෙම දැනුමෙහි අවබෝධාත්මක මට්ටම බොහෝ දුරට සීමිත බව ෆූකෝ විසින් ම වරක් ප්‍රකාශ කර තිබේ (Foucault, 1983).

හෙගේලියානු මතධාරීන්, ප්‍රපංචවේදීන්, මාක්ස් සහ වෙබර් වැනි පදනම් න්‍යායධාරීන්, නිට්ෂේ වැනි දාර්ශනිකයින් සේ ම සමකාලීන බුද්ධිමය කතිකාව තුළ එකිනෙකට වෙනස් මානයන් ගවේෂණය කළ ෂින් බෝද්‍රියාඩ් (1929-2007), ෂාක් ඩෙරීඩා (1930-2004), ෂොන් ෆ්‍රාන්සුවා ලියොටාඩ් (1924-1998) වැනි පශ්චාත් නූතනවාදීන් සහ පශ්චාත් ව්‍යුහවාදීන්ගේ පසුබිම් ෆූකෝගේ ශාස්ත්‍රීය චින්තනය කෙරෙහි බලපෑම්

කර තිබේ. පශ්චාත් ව්‍යූහවාදියෙකු වූ ෆූකෝ, පශ්චාත් නූතනවාදියෙකු ලෙස තමා හඳුන්වාදීම ප්‍රතික්ෂේප කළ අයෙකු වුවත් නූතනත්වයේ ගැටලු ආමන්ත්‍රණය කළ පශ්චාත් නූතනවාදීන් අතරට ඔහු අයත් වේ. බලය-දැනුම කාරකයන් වශයෙන් සමාජයේ පුළුල් වශයෙන් පැතිරී පවත්නා ආකාරය අවබෝධ කරගැනීමට සේ ම එය සත්‍යය හා සම්බන්ධ වන ආකාරය වටහා ගැනීමට ෆූකෝ උත්සාහ ගෙන තිබේ. එනම්, ඔහු වරෙක දැනුමේ ආරම්භය පිළිබඳ ගවේෂණය කරන අතර, තවත් වරෙක අප්‍රකට ව පවතින ලිංගිකත්වය වැනි සමාජ ප්‍රපංචයක් බලය සහ දැනුම සමඟ සම්බන්ධ වන ආකාරය පැහැදිලි කර තිබේ. පොදුවේ ගත් කල ෆූකෝ, සමාජ න්‍යායධාරියෙකු වශයෙන් අන්තර් විෂයීක නව දැනුම උත්පාදනය කිරීමෙහි ලා ගත් ප්‍රයත්නයන්, "බලය-දැනුම සාකච්ඡාව වටා භ්‍රමණය වන" හෙයින් මෙම සාකච්ඡාව සමාජ විද්‍යාත්මක කියැවීමකට හසු කර ගැනීම මෙම ලිපියේ අභිලාෂය යි (ද සිල්වා සහ අත්තනායක, 2016: 358).

මෙම ලිපිය පශ්චාත් නූතනවාදී සුසමාදර්ශය තුළ ෆූකෝඩියානු සාකච්ඡා ස්ථාපනය කිරීමෙන් ආරම්භ වී, ෆූකෝගේ බලය-දැනුම සාකච්ඡාවට හැඳින්වීමක් සිදු කර, දැනුම-බලය සත්‍යය සමඟ සම්බන්ධ කර එය කතිකාවක් වශයෙන් හඳුනාගැනීම සිදු කර, ඉන් අනතුරුව සම්භාව්‍ය සාකච්ඡාවලින් විතැන් වන ෆූකෝගේ බලය පිළිබඳ හැඳින්වීමක් සිදු කිරීම කරා ගමන් කරයි. ෆූකෝගේ එක් එක් ශාස්ත්‍රීය සාකච්ඡාවන් සැකෙවින් දැනුම-බලය සමඟ සම්බන්ධ වන ආකාරය විග්‍රහයෙන් අනතුරු ව, අවසාන වශයෙන් ෆූකෝගේ බලය-දැනුම සාකච්ඡාව සම්බන්ධයෙන් මතු වූ විවේචන සහ ප්‍රති-තර්ක සාකච්ඡා කර තිබේ.

## පශ්චාත් නූතනවාදය, පශ්චාත් ව්‍යුහවාදය සහ මිචෙල් ෆූකෝ

පශ්චාත් නූතනත්වය, පශ්චාත් නූතනවාදය සහ පශ්චාත් නූතන සමාජ න්‍යාය සමාජ විද්‍යාව තුළ බහුල ව භාවිත වන්නා වූ පද වේ. පශ්චාත් නූතන පදය බහුලව භාවිත කෙරෙන්නේ, බටහිර රටවල් වැඩි වශයෙනුත්, පෙරදිග රටවල් අඩු වැඩි වශයෙනුත් පහළ වූ තීව්‍ර තොරතුරු සහ පාරිභෝගික සමාජවල දක්නට ලැබෙන ඓතිහාසික සංස්කෘතික සංසිද්ධීන් පහදා දීම සඳහා ය (දෝෂි, 2008: 45).

විසිවන සියවස මුල් භාගය වන විට ආධිපත්‍යය දැරූ නූතනත්ව මතවාදය සාම්ප්‍රදායිකත්වය ප්‍රතික්ෂේප කරමින් තාක්ෂණය සහ නව සොයාගැනීම්, ධනවාදය සමඟ අනුබද්ධ වූ අතිවිශාල කාර්මික දියුණුව ආදිය ඉස්මතු කරන්නක් වූ අතර, මෙකී නූතනත්ව ව්‍යාපාරයේ අතුරු ඵල වූ සමාජ අර්බුද ගවේෂණයෙහිලා උපයුක්ත කරගැනුණේ මාක්ස්, වෙබර් සහ ඩර්කයිම්ගේ සම්භාව්‍ය සමාජ විද්‍යා න්‍යායන් ය. කෙසේ නමුත් නූතනත්වය අපේක්ෂිත තරම් සර්ව සුභවාදී ප්‍රතිඵල ගෙන නොදීමත්, නූතනත්වය සම්බන්ධයෙන් පළ කළ බොහෝ මතවාද නැවත සළකා බැලීමේ අවශ්‍යතාව මතුවීමත් නව්‍ය ආකාරයකින් සමාජය විග්‍රහ කිරීමේ අවශ්‍යතාවය ඇති කරන ලදි. උදාහරණ වශයෙන්, අතිශයින් තාර්කික යැයි දක්වන නූතනත්වය තුළ දියුණු කාර්මික සමාජවල අනාගමිකත්වය වැනි තාර්කික - නොවන තත්ත්ව අපේක්ෂිත නමුත්, එම සමාජ කෙරෙන් ආගමිකත්වය තුරන් වීමට වඩා වෙනස් ආකාරවලින් එය මතු වීමක් සිදු විය. අනෙක් අතට, නූතන තාක්ෂණික දියුණුව සමඟ අවදානම අවම කරගත හැකි ක්‍රම සොයා තිරසාර සමාජයක් නිර්මාණය කිරීම අපේක්ෂිත වුවත්, නූතනත්වය තුළින් ම "අවදානම් සමාජයක් නිර්මාණය වීම" (Beck and Beck, 2000; Birkmann, Feldmeyer and Welle, 2017) වර්තමානය වන විට සිදු වී තිබේ. මෙම සන්දර්භය තුළ සාමාන්‍යකරණය

[1] තුළින් සාර්ව සමාජ විශ්ලේෂණය කළ සම්භාව්‍ය න්‍යායන් අභියෝගයට ලක් කරන, නමුත් ඒවායින් ආභාසය ලබා පශ්චාත් නූතනවාදය බිහිවන අතර, එය බහුවිධ ශික්ෂණයන්ගේ ආරක් අනුගමනය කරමින් ක්ෂුද්‍ර මට්ටමින් සමාජය විශ්ලේෂණයට නව අදහස් ගෙන එන ලදි. ඒ අනුව "සමාජ ජීවිතයේ ඇතිවූ නව තත්ත්වයන්" පශ්චාත් නූතනත්වය ලෙස බර්නාඩ් රොසෙන්බර්ග් (1950) ට අනුව හැඳින්විය හැකි ය.

ඒ අනුව, උක්ත පසුබිම තුළ ව්‍යවහාරයට පැමිණි ඉතා ප්‍රචලිත මතවාදයක් බවට පත් වූ පශ්චාත් නූතනවාදය, නූතනත්වයේ අසාර්ථකභාවයන්ට ප්‍රතිරෝධීව බිහි වූවක් බව පැවසීම සාධාරණ වේ. Preda (2001) දක්වන ආකාරයට, සමාජ විද්‍යාව තුළ පශ්චාත් නූතනවාදය යනු කල් ගත වූ ධනවාදයේ (late-capitalism) සංස්කෘතික සහ සමාජයීය අංග විශ්ලේෂණය කිරීමක්, නූතනත්ව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සමාජ විද්‍යාත්මක න්‍යායේ සිදු වන විවේචනයක් සේ ම, සමාජ විද්‍යාත්මක ගවේෂණය නව මානයක් කරා ගමන් කරවන්නක් ද වේ. ඔහු තවදුරටත් දක්වන ආකාරයට, පශ්චාත් නූතනවාදයේ මූලික සංකල්ප වන්නේ, විෂය (subject), අනන්‍යතාවය (identity), පඨිතය (text)[2]/ සහ සංකේත (symbols) යන ඒවා ය. ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් සැළකිය යුතු කාර්යභාරයක් ඉටු කරන, සංකේතීය අර්ථ පැතිර පවත්නා වූ වැදගත්කමක් දරන සහ සමාජීය අනන්‍යතා කැඩී බිඳී ගිය තත්ත්වයක් සහිත වූ සමාජ පර්යායක් ඉහත කී සංකල්ප පාදක කරගෙන නිර්මාණය

---

[1] මහා ආඛ්‍යාන (meta-narratives) තුළින් ලෝකයේ ඇති සෑම දෙයක්ම විමසීමට, විශ්ලේෂණය කිරීමට උත්සාහ කිරීමට සම්භාව්‍ය න්‍යායන් තුළින් උත්සාහ කර තිබේ.

[2] පඨිතයක් යනු, අප විසින් කියවීමට බඳුන් කරනු ලබන ඕනෑම දෙයක්ය; එය ග්‍රන්ථයක්, චිත්‍රයක්, සිනමා නිර්මාණයක්, ගීතයක් මෙන්ම පුද්ගලයෙක් වුවද විය හැකිය. අප විසින් යම් කියැවීමකට හසු කරගන්නා එවැනි දේ පඨිත වේ (Derrida q.f. Wood, 1988).

වන පශ්චාත් නූතන සමාජයන් තුළ දැකගත හැකි බව ඔහු තවදුරටත් පෙන්වා දෙයි.

එකිනෙකට වෙනස් බුද්ධිමය සන්දර්භයන්හි බලපෑම ලබන මිචෙල් ෆූකෝ තමා පශ්චාත් නූතනවාදියෙකු ලෙස හැඳින්වීම ප්‍රතික්ෂේප කරමින් පශ්චාත් ව්‍යුහවාදී කාණ්ඩයෙහි ලා තමාව නිර්වචනය කළ නමුත්, ඔහු පශ්චාත් නූතනවාදියෙකු ලෙස සැළකේ. විශේෂයෙන් ම, පදනම් න්‍යායධාරීන් වන මාක්ස් සහ වෙබර්ගේ තර්කනයන් පශ්චාත් නූතන සමාජ විෂයයෙහි විවේචනයට බඳුන් කළ හැකි ආකාරය ෆූකෝ විසින් ග්‍රහණය කරගැනීම, ඊට බලපාන්නට ඇත. අනෙක් අතට, ෆූකෝ පශ්චාත් නූතනවාදියෙකු ලෙස සැලකීමේ බලවත් ම කාරණය වන්නේ ඔහු ඉදිරිපත් කරන්නාවූ "බලය - දැනුම" සාකච්ඡාව; පශ්චාත් නූතනත්වයේ සියලු ම පැතිකඩයන් සම්බන්ධ කරන්නා වූ තේමාව වීමයි. ඔහු පශ්චාත් නූතනවාදය නිර්වචනය කරනුයේ 'කතිකාව' මත වන අතර, පශ්චාත් නූතනවාදය - දැනුම - බලය අතර සම්බන්ධතා ඔහු විසින් විවරණය කරනු ලබයි. එනම් "පශ්චාත් නූතනත්වය යනු සෑම අතින් ම දැනුම සහ බලය අතර පවතින සම්බන්ධතාව" වශයෙන් ඔහු දක්වයි (ද සිල්වා සහ අත්තනායක, 2016). ඒ අනුව නූතනත්වය සමඟ බලය සම්බන්ධ විවිධ ආකාර ලොව පුරා බිහිවීමත්, දේශපාලනික ව්‍යාපාරවල පටන් ආගමික ව්‍යාපාර දක්වා එහි ස්වරූප විතැන් වීමත් ආදී වූ විකෘතිකරණ හමුවේ බලයට තථ්‍ය වූ නිර්වචනයක් ලබාදුන් හෙයින්, පශ්චාත් නූතනවාදියෙකු ලෙස ෆූකෝ දැකිය හැකි අතර, බලය-දැනුම සාකච්ඡාවේ බිහිවීම ද පශ්චාත් නූතනත්වය හා බැඳී පවතින බව මෙසේ පැහැදිලි කළ හැකි ය. ඒ අනුව ෆූකෝගේ බුද්ධිමය දිශානතිය තුළ කේන්ද්‍රීය තත්ත්වයක් උසුලන බලය-දැනුම සාකච්ඡාවේ ඓතිහාසික උත්පාදනය පශ්චාත් නූතනවාදය සමඟ බැඳී පවතින බව කිව හැකි ය.

පශ්චාත් ව්‍යූහවාදයට ෆූකෝ දක්වන සම්බන්ධතාව හේතුවෙන්, ව්‍යූහවාදය සහ පශ්චාත් ව්‍යූහවාදයේ මූලික තර්කනයක් සම්බන්ධ ව මෙහි දී සැකෙවින් හෝ දැක්වීම අවශ්‍ය වේ. සොසියර්ගේ ව්‍යූහවාදී අර්ථකථන අනුගමනය කරමින්, ඊට වඩාත් ප්‍රතිරෝධී ව බිහිවන්නක් වශයෙන් පශ්චාත් ව්‍යූහවාදය හඳුන්වා දිය හැකි ය. පශ්චාත් නූතනවාදය තුළින් බලය-දැනුම දැකිය හැකි නමුත් ෆූකෝ වඩාත් එය විග්‍රහයට උත්සුක වූයේ භාෂාව සහ පඨිත පදනම් කරගත් කතිකාව ඔස්සේ ය. මේ හේතුවෙන් නවීකරණය විවේචනයට පාත්‍ර කරන්නා වූ බහුවිධ අංශ සහිත පශ්චාත් නූතනවාදයට වඩා, භාෂාව සම්බන්ධ ගැඹුරු තර්කනයක් නිර්මාණය කිරීම අරභයාම බිහි වූ ව්‍යූහවාදී සම්ප්‍රදායේ, පශ්චාත් ව්‍යූහවාදයට තම සාකච්ඡාමය විග්‍රහයේ උත්පත්තිය කේන්ද්‍ර කිරීමට ඔහු උත්සුක වූ බැව් උපකල්පනය කළ හැකි ය. කෙසේ නමුත් සමාජ න්‍යායේ කොටස් වශයෙන් පවතින ව්‍යූහවාදය - පශ්චාත් නූතනවාදය - පශ්චාත් ව්‍යූහවාදය එකිනෙකින් පැහැදිලි ව බෙදා වෙන් කළ නොහැකි වන්නේ ඒවා එකිනෙක හා බැඳී පවතින බැවිනි.

ව්‍යූහවාදී න්‍යායධාරියෙකු වූ ලෙවී ස්ට්‍රවුස් ප්‍රකාශ කළ ආකාරයට ලෝකය යනු අදහස්වල නිෂ්පාදනයකි. ව්‍යූහවාදීන් උත්සාහ කරනුයේ මෙම අදහස්වලට යටින් පවතින තර්කය හඳුනා ගැනීමට ය. එය සමාජයේ සංස්කෘතිය හා සම්බන්ධ වී තිබෙන ව්‍යූහය හෝ ආධිපත්‍යය මත පදනම් වූ තර්කනයක් විය හැකි ය. එසේ ම එය ඒවායෙහි තාර්කික පදනම සොයා බලන අතර, සමාජය විසින් මිනිසා නිර්මාණය කරන බව ව්‍යූහවාදය තර්ක කරයි. විශේෂයෙන් ම ප්‍රංශයේ උපදින ව්‍යූහවාදයේ පදනම, ඩර්කයිම් සහ කොම්ටෙගේ අදහස්වල බලපෑමට නතු වීමත්, ඒ ඔස්සේ පුද්ගලයාට වඩා සමස්තයට වැඩි වැදගත්කමක් ලබා දී තිබීමේ තත්ත්වය, ඔවුන්ට පසුව සංවර්ධනය වන මෙම ව්‍යූහවාදය තුළ නොනැසී පැවතී ඇති බව කිව හැකි ය.

කෙසේ නමුත් ව්‍යුහවාදී තර්කනයේ එක් උපශාඛාවක් වන වාග් විද්‍යාත්මක ව්‍යූහවාදයේ බලපෑමට මිචෙල් ෆූකෝ නතු වූ අතර, පශ්චාත් කාලීනව ඔහු විසින් ම එය විවේචනයට බඳුන් කර ඇත. වාග් විද්‍යාත්මක ව්‍යූහවාදය ඉදිරිපත් කරන ෆර්ඩිනන් ඩි සොසියර් භාෂාවේ සාම්ප්‍රදායික අර්ථය නොපිළිගන්නා අතර, ඒ වෙනුවට ඔහු දක්වනුයේ වචනයක අර්ථය වචනය තුළ නොපවතින බවත්, එය වටහාගත යුත්තේ තවත් වචනයකට එය දක්වන සම්බන්ධතාව මත වන බවත් ය. එසේ ම වචන සංඥාකාරක[3] (signifier) වන අතර, ඒවා මඟින් ප්‍රකාශ අර්ථ සංඥිත[4] (signified) වේ. ඒ අනුව භාෂාවේ අර්ථ මඟින් අප දේවල් නිර්මාණය කරගෙන තිබෙන බව වාග් විද්‍යාත්මක ව්‍යූහවාදයේ දැක්වේ. ඒ අනුව පසුකාලීනව ලෙවී ස්ට්‍රවුස් සහ රෝලන්ඩ් බාර්ත් මෙය වෙනත් අංශ වෙත ව්‍යාප්ත කර තිබේ (ද සිල්වා සහ අත්තනායක, 2016). ව්‍යූහවාදය සාර්ව මට්ටමින් සමාජය දෙස බැලීමත්, මහා ආඛ්‍යාන මත පදනම් ව ලොව සාමාන්‍යකරණය කිරීමට ප්‍රයත්න දැරීමත්, එය දැඩි ලෙස විවේචනයට පාත්‍ර වීමටත්, එය ප්‍රතික්ෂේප කරමින් පශ්චාත් ව්‍යුහවාදය ඉදිරිපත් වීමටත් බලපාන ලදි.

ඒ අනුව, අදහස්වල ඉතිහාසය පිළිබඳව ගවේෂණය කළ ෆූකෝත්, දර්ශනය සහ විසංයෝජනය[5] සම්බන්ධ කළ ෂාක් ඩෙරීඩාත්, ව්‍යුහවාදය පශ්චාත් ව්‍යුහවාදය බවට පරිවර්තනය කළ පශ්චාත්

---

[3] යම් වචනයකින් කියැවෙන භෞතික දෙය සංඥිතය වේ.

[4] එම වචනයේ අදහස සංඥාකාරකය වේ. උදාහරණ වශයෙන්, පුටුව යන වචනයට අප සිතෙහි මැවෙනා භෞතික වස්තුව සංඥිතය වේ. එම භෞතික දේ හඳුනාගැනීමට අප යොදාගන්නා සංඥාව - වචනය "පුටුව" වේ. එය භාෂාවෙන් භාෂාවට වෙනස් වචන වලින් හඳුන්වනු ලැබේ. එනම් එකිනෙකට වෙනස් සංඥාකාරකවලින් එකම සංඥිතයක් හඟවයි. සිංහල භාෂාවේ එය "පුටුව" වන විට, දෙමළ භාෂාවේ එය "**கதிரை**" වන අතර, ඉංග්‍රීසි භාෂාවේ එය "chair" වේ. එකිනෙකට වෙනස් සංඥාකාරක වලින් එකම සංඥිතයක් හඟවන ආකාරය මෙහිදී පෙනීයයි.

[5] ඩෙරීඩාගේ විසංයෝජනය ව්‍යුක්ත අදහස වන්නේ, යමක අපට මතුපිටින් දකින දෙයින් ඔබ්බට ගිය වෙනත් අර්ථයක් පවතින බවත්, එය වටහා ගැනීමට නම් මතුපිටින් පෙනෙන දේ ඉවත් කර බැලිය යුතු බවත්ය.

නූතනවාදීන් ලෙස ශාස්ත්‍රීය කතිකාවන්හි පෙන්වා දී තිබේ (ද සිල්වා සහ අත්තනායක, 2016ඃ 566) පෙන්වා දේ. එනයින්, ව්‍යුහවාදයේ පදනම විවේචනය කළ ප්‍රධාන චින්තකයන් අතර මොවුහු දෙදෙනා වැදගත් වෙති. කෙසේ නමුත්, "පශ්චාත් ව්‍යුහවාදය" යන යෙදුම ප්‍රංශ බුද්ධිමය කතිකාව තුළ ගොඩනැගුණක් නොවන බවත්, ඇමෙරිකානු න්‍යායධාරීන් විසින් ගොඩනගන ලද්දක් වන බවත් Poster (1989) පෙන්වා දේ. විශේෂයෙන් ම, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය විසින් ගොඩනගන ලද විචාර න්‍යාය සහ මෙකී පශ්චාත් ව්‍යුහවාදය අතර විවාදය ගෙනගිය ප්‍රධාන පාර්ශ්වකරුවා බවට ඇමෙරිකාව පත්වීම මෙම පද නිරුක්තිය ඇමෙරිකාවේ සිදු වූ බවට සාක්ෂ්‍ය දරයි (Poster, 1989: 04-05). ඒ අනුව පශ්චාත් ව්‍යුහවාදය ඇමෙරිකා එක්සත් ජනපදයේ බුද්ධිමය මණ්ඩප කිහිපයකට ප්‍රාදේශික වන අතර, ප්‍රංශය මුල් කරගෙන බිහිවූ, තම බුද්ධිමය දිශානතීන් යාවත්කාලීන කරගත් න්‍යායධාරීන් කිහිපදෙනෙකු මෙහි හඳුනාගත හැකි ය. ඒ අතර, ජැක් ලකාන්, මිචෙල් ෆූකෝ, ෂාක් ඩෙරීඩා, ෂින් බෝද්‍රියාඩ්, ගිලස් ඩිලූස්, ෂින් ෆ්‍රාන්සුවා ලියොටාඩ් ආදීන් ප්‍රමුඛ වේ. ෆූකෝ ඇතුළු පශ්චාත් ව්‍යුහවාදීන් පෙන්වා දෙන ආකාරයට, න්‍යායධාරියාට සහ ඔහුගේ/ඇයගේ කතිකාවටත්, වාග් විද්‍යාත්මක සන්දර්භය තුළ සමාජීය ක්ෂේත්‍රය නිර්මාණය වන ආකාරය සම්බන්ධයෙනුත්, භාෂාව භෞතිකව බලපානු ලැබේ (Smith, 1972 q.f. Power, 2011).

භාෂාවේ මෙම බලපෑම පිළිබඳව Poster (1989), උදාහරණ වශයෙන් දක්වනුයේ, ෆූකෝගේ කතිකාව (Discource), බෝද්‍රියාඩ්ගේ කේතය (Code), ඩෙරීඩාගේ ලිවීම (*Écriture*), ලියොටාඩ්ගේ දණ්ඩනය සහ විවාදය (*Phrases et Le Différend*) යන ඒවා ය.

ඒ අනුව, පසුගිය දශක දෙකක බුද්ධිමය ඉතිහාසය තුළ මහද්වීප අතර යම් පෙරළිකාර තත්ත්වයක් නිර්මාණය කිරීමට "පශ්චාත් ව්‍යුහවාදය"

යන යෙදුම භාවිත කිරීමේ වලංගුභාවය බලපා තිබේ. වාග්විද්‍යාත්මක ව්‍යූහවාදී ආකෘතිගතකරණයට මෙම න්‍යායධාරීන් විරුද්ධ වූ අතර එහි බලපෑමටද මොවුන් ලක් විය. එසේම තවදුරටත් ඔවුන් පැහැදිලි ව ම ප්‍රතිරෝධය දැක්වූ කරුණක් වශයෙන් ව්‍යූහවාදී ඥාන විභාගය (episteme) හඳුනාගත හැකිය. පශ්චාත් ව්‍යූහවාදීන් මූලිකවම මාක්ස්වාදී අදහස් පිළිගත් අතර, අනෙක් අතට ඒවා ප්‍රශ්න කිරීමටත්, ඒවා වර්ධනය කිරීමටත්, ඒ ඔස්සේ ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂයට ප්‍රතිරෝධයක් තම න්‍යායයන් හරහා ගොඩනැගීමටත් උත්සාහ දරන ලදි (Poster, 1989: 05). Poster (1989) තවදුරටත් පෙන්වාදෙන අංශයක් වන්නේ පශ්චාත් ව්‍යූහවාදීන්ගේ න්‍යාය සම්බන්ධ අර්ථ ගැන්වීමයි; ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂය දක්වන ආකාරයට පශ්චාත් ව්‍යූහවාදීන් න්‍යායක් ලෙස හඳුනාගනුයේ, "යථාර්ථය පිළිබඳ යෙදුම් ක්‍රියාත්මක කිරීමට තිබෙන පාරභෞතික අභිනයන් දක්වා විහිදෙන, සංකල්පීය වර්ගීකරණයන්ගේ ඥාන විභාගාත්මක ප්‍රයත්නයක්" වශයෙනි.

ඒ අනුව ව්‍යූහවාදීන්ට වඩා වෙනස් ව, පශ්චාත් ව්‍යූහවාදීන් පෙන්වා දෙනුයේ, '*භාෂාවට වඩා - වචනයට වඩා එහි අර්ථය ප්‍රබල වේ'ය යන්න යි.* ඒ අනුව භාෂාව, වචනය අභිබවා ගිය අර්ථයක කටයුතු කරයි. එනම්, කිසියම් නිර්මාණයක් විශ්ලේෂණය කරන විට පශ්චාත් ව්‍යූහවාදීන් නිර්මාණයේ ගුණ - අගුණ විමර්ශනය කිරීම වෙනුවට, එය මතුවන සන්දර්භය, එහි නිමග්න ව පවතින අර්ථය විමසා බලයි. ඒ තුළින් යථාර්ථය ප්‍රති-ගවේෂණය කිරීම හෙවත් ව්‍යූහ නැවත පිරික්සීමකට ලක් කිරීම, පශ්චාත් ව්‍යූහවාදීන් විසින් සිදු කරනු ලැබේ. එසේ ම ව්‍යූහවාදය තුළින් දැඩි ලෙස ප්‍රතික්ෂේප වූ පුද්ගලික අර්ථය පශ්චාත් ව්‍යූහවාදීන් විසින් නැවත කියැවීමකට හසු කරගන්නා අතර, ඩෙරීඩා වැනි පශ්චාත් ව්‍යූහවාදීන් විසින් පුද්ගලිකත්වයට තැනක් දෙමින්, පුද්ගලිකත්වය තුළින් සමස්තයට අභියෝග කරනු ලැබේ. ඒ අනුව, පශ්චාත් ව්‍යූහවාදියෙකු

වශයෙන් මිචෙල් ෆූකෝ ද (1979) දී සිය තර්කනය (Reason) පිළිබඳ විචාරය වර්ධනය කරනුයේ බුද්ධිමය භූමිකාව ද ඊට ඇතුළත් කරමිනි. ඔහු සාම්ප්‍රදායික බුද්ධිමය ඉදිරිපත් කිරීම් දැඩි ලෙස විවේචනයට ලක් කළ අතර, විශ්වීය බුද්ධිමය විචාරයේ පැවැත්ම/ ස්ථානය, බුද්ධිමය සමාජ විද්‍යාව සහ ඥාන මීමංසාව (Sociology of the Intellectuals/Epistemology) සංවර්ධනය කිරීම ෆූකෝගේ අවශ්‍යතාව විය (Poster, 1989: 50). ඒ අනුව මෙම අවශ්‍යතාව මත දැනුමේ පුරාවිද්‍යාවත්, දැනුම - බලය සාකච්ඡාව ප්‍රායෝගීකරණය වන ආකාරයත් ගවේෂණය කිරීම ෆූකෝ විසින් සිදු කරන ලදි. ඒ අනුව මෙහි දී විසංයෝජනයට ලක් කෙරෙන දැනුම - බලය සාකච්ඡාව මතුවන්නා වූ පසුබිම පශ්චාත් ව්‍යූහවාදය සමඟ ද බැඳී පවතින බව පැහැදිලි වේ.

### ෆූකෝගේ බලය - දැනුම: සාකච්ඡාවට හැඳින්වීමක්

මිචෙල් ෆූකෝගේ ශාස්ත්‍රීය ජීවිතයේ මැද භාගය තුළ ඔහු ඉදිරිපත් කළ ග්‍රන්ථය මඟින් ඔහු තර්ක කරනුයේත්, පරීක්ෂා කිරීමට උත්සාහ කරන ලද්දේත් දැනුම, බලය හා මානව විෂය අතර තිබෙන සම්බන්ධතාවය පිළිබඳ ය (Gallagher, 2008: 396). බලය සම්බන්ධ සාම්ප්‍රදායික, ප්‍රචලිත නිර්වචනය වන මැක්ස් වෙබර්ගේ අර්ථගැන්වීමට වඩා වෙනස් ආකාරයකින් බලය හඳුනාගැනීමට ෆූකෝ උත්සුක විය. කෙසේ නමුත් වෙබර්ගේ තාර්කිකත්වය පිළිබඳ අදහස්වල බලපෑමට ෆූකෝ නතු වූ බව මෙයින් පැහැදිලි වේ.

වෙබර් දක්වන ආකාරයට බලය යනු, "යම් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් තම කැමැත්ත අනුන් මත බලහත්කාරයෙන් යෙදීම වේ" (වෙබර් උපුටාගත්තේ, පෙරේරා, 2011). තවදුරටත් ඔහු දක්වන පරිදි, සමාජ ජීවිතයේ සෑම අවස්ථාවක ම තාර්කිකත්වය ක්‍රියාත්මක වන අතර, එය "යකඩ කූඩුවක් තුළ සිටීමට" ඔහු ආදේශ කර ඇත. ෆූකෝ මෙම

යකඩ කූඩුව පිළිබඳ අදහස ප්‍රතික්ෂේප කරන අතර, ඔහු තර්ක කරනුයේ බොහෝ අවස්ථාවල දී බොහෝ සමාජ ආයතන ''තාර්කිකත්වය'' ප්‍රතික්ෂේප කරන බවයි (ද සිල්වා සහ අත්තනායක, 2016: 239). මාක්ස් සහ වෙබර් යන දෙදෙනාගේ ම ශාස්ත්‍රීය කාර්යයන් පූර්වාබෝධ කරගත් ෆූකෝ, තම ශාස්ත්‍රීය කාර්යයන් උක්ත ප්‍රධාන න්‍යායධාරීන්ගේ අදහස් තුළින් මෙන් ම ඒවාට ප්‍රතිරෝධීව ඉදිරිපත් කළ අතර, සමාජ විද්‍යාවට එහි ඇති අදාළත්වය වටහාගත හැක්කේ සංකීර්ණ සමාජ විද්‍යා විෂයක් ලෙස මෙන් ම පරස්පර විරෝධීබව අත්දකිමිනි (Power, 2011: 35).

ඒ අනුව ඔහු, මාක්ස්ගේ ආර්ථිකය පදනම් කර ගත් විශ්ලේෂණයෙන් ද ඔබ්බට යමින් ලිංගිකත්වය, මානසික රෝග හා දණ්ඩ නීතිය වැනි ආර්ථිකමය නොවන සාධක අධ්‍යයනය කරයි. එහි දී ඔහු තර්ක කරනුයේ මෙම ආයතන කිසිදු අවස්ථාවක දී අපක්ෂපාතී ව සහ ස්වාධීන ව වැඩ නොකරන බවත්, සමාජයේ සංකීර්ණ බල මෙහෙයුම් සමඟ ඒවා බැඳී පවතින බවත් ය. එසේ ම, සැම අවස්ථාවක ම තාර්කිකත්වයට ප්‍රතිරෝධයක් පවතින බව ෆූකෝ සඳහන් කළ අතර, කාල් මාක්ස්ගේ ආර්ථික නියතිවාදයෙන් බොහෝ කරුණු ලබාගත් නමුත්, ඉන් ඔබ්බට ගොස් බලයේ සාර්ව මට්ටම වෙනුවට, බලයේ ක්ෂුද්‍ර දේශපාලනය පිළිබඳව මූලික උනන්දුවක් ඔහු දක්වයි. එහි ලා, බලය පිළිබඳ බහු විෂයීක සංකල්පගතකරණයක් ඔහු හරහා සිදුවිය. ඒ හරහා මාක්ස්ගේ බලය සාමාන්‍යකරණය පිළිබඳ තර්කය පූර්ණ වශයෙන් ෆූකෝ පිළිනොගත් අතර, ඒ වෙනුවට බලය සමස්ත සමාජය තුළ පවතින ආකාරය දූරස්ථ ව බැලීමට වඩා ක්ෂුද්‍ර මට්ටමින් එය විමසා බැලිය යුතු බව ඔහු දැක්වීය (ද සිල්වා සහ අත්තනායක, 2016: 320).

ඒ අනුව "බලය යන්න තනි පුද්ගලයෙකු විසින් බලාත්මක කරන්නේ" ය යන පුද්ගලය කේන්ද්‍රීය නිර්වචනයත්, "අධෝ ව්‍යූහයේ ආර්ථික සාධක විසින් බලය පූර්ණ වශයෙන් ම තීරණය කරනු ලබන්නේ

ය" යන බලය පිළිබඳ වෙබේරියානු සහ මාක්ස්වාදී විග්‍රහයන් ෆූකෝ ප්‍රතික්ෂේප කළ බව පෙනී යයි. එනම්, ඉන් ඔබ්බට ගිය, *දැනුම තුළින් ගොඩනැගෙන බලයත්, බලය තුළින් ගොඩනැගිය හැකි දැනුමත්* (***knowledge power Vs power knowledge***) යන සංකල්පගතකරණය ඔහු විසින් සාකච්ඡාවට පාදක කරගත් සිද්ධි/ ආයතන තුළින් විශ්ලේෂණය කරන බැව් කිව හැකි ය. ඔහු 'දැනුම පමණක් බලය ලෙස ගත හැකි ය' යන අදහස ප්‍රතික්ෂේප කළ අතර, එය විවිධාකාර සන්දර්භයන්හි දී බලය භාවිත කිරීම සඳහා දායක වන බව සඳහන් කළේ ය. නිට්ෂේගේ අදහස් ගණනාවක් ෆූකෝ විසින් තම ශාස්ත්‍රීය සාකච්ඡාවන් සඳහා උපයුක්ත කරගත් අතර, ඉන් එකක් වශයෙන් තවදුරටත් බලය සහ දැනුම අතර පවතින සම්බන්ධතාවය ගත හැකි ය. විශේෂයෙන්ම, නිට්ෂේ "බලය දැනුමේ එක් ආකාරයක් වන බවත්, එය නිර්මාණය වී ප්‍රායෝගීකරණය වනු විනා සීමා කීරීමක් සිදු නොකරන බවත්" දැක්වූ අතර, මෙය තවදුරටත් සමාජ විද්‍යාත්මක සාකච්ඡාවට නතු කරගනුයේ ෆූකෝ විසින් ය (Poster, 1989: 118).

ෆූකෝගේ දැනුම - බලය සංකල්පයේ මූලික තර්කනය තුළ, දැනුම පමණක් මඟහැරිය නොහැකි ප්‍රතිඵලයක් සම්පාදනය නොකරන බවත්, බලයට ද දැනුම නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතින බවත් කියැවේ. එබැවින්, බලය මඟින් දැනුම නිෂ්පාදනය කරන්නේය යන්න ෆූකෝගේ ප්‍රධාන තර්කය බවට උකහා දැක්විය හැකි ය. මෙය සරල උදාහරණයක් ඇසුරින් කිවහොත්, යටත් විජිතවාදය ඔස්සේ ඉංග්‍රීසි අධ්‍යාපන දැනුම සමාජගත කිරීම; බලය සහිත සමාජ පැලැන්තියක් නිර්මාණය කිරීමේ මූලික සාධකයක් වන අතර, එම දැනුම සමාජගත වනුයේ යටත්විජිත පාලන අධිකාරියේ නෛතික ආධිපත්‍යය යටතේ ය. එහෙයින් බලය භාවිත කර දැනුමක් උත්පාදනය කරවන විට, දැනුම ඔස්සේ අනෙක් අතට බලයක් නිර්මාණය වී තිබේ.

එනමුත් මෙවන් සරල උදාහරණයක් මඟින් ෆූකෝ බලය හඳුනාගත් ආකාරය පරිපූර්ණ වශයෙන් දැක්විය නොහැකි බව කිව යුතු ම ය. මන්දයත්, ඔහු දක්වන බලයෙහි පරස්පර විරෝධී ගුණාංග (characteristics) සහ දැනුම කතිකාවක් ලෙස 'සත්‍යය යැයි පිළිගනු ලබන දේ'[6] සමඟ සම්බන්ධ කරන ආකාරය සංකීර්ණ සහ නව්‍ය ආකාරයේ සාකච්ඡාවක් පශ්චාත් නූතන සමාජ න්‍යායට එක් කරන හෙයිනි. ෆූකෝට අනුව, බලය සහ දැනුම ඍජුව ම එකිනෙකා හඟවයි. දැනුම් ක්ෂේත්‍ර තුළ සහසම්බන්ධතාවයෙන් සමන්විත බල සම්බන්ධතාවයක් නොමැත. ඒ ආකාරයෙන්ම පූර්ව කාල්පනික නොවූ සහ ඒ හා සමඟ ම බල සම්බන්ධතාවයන්ගෙන් සමන්විත නොවූ කිසිඳු දැනුමක් ද නොමැත. ඒ අනුව බලය පිළිබඳ ව ඔහු දක්වන ගුණාංග සැකෙවින් ගතහොත්, සමාජය පුරාවට ම බලය විෂමතාවයෙන් යුතු වේ. එය නිරන්තරයෙන්ම සංසරණය වේ. එසේම එය එක් එක් ප්‍රදේශ අනුව ප්‍රාදේශීකරණය නොවන අතර කිසිවෙකු අත රැඳී නොපවතී. එය වත්කමක්, වෙළඳ භාණ්ඩයක් ලෙස සංසරණය විය නොහැකි සේම එක ම අවස්ථාවකදී බලය භාවිත කිරීම සහ බලයට අනුව හැසිරවීම යන ද්විත්වය ම සිදුවේ (ද සිල්වා සහ අත්තනායක, 2016: 320-321).

මෙකී සංකීර්ණ ස්වභාවයකින් යුතු බලය සම්බන්ධ ඔහුගේ විස්තරාත්මක අර්ථ ගැන්වීම ඉදිරියේදී සාකච්ඡා කෙරේ.

දැනුම යනුවෙන් ෆූකෝ අදහස් කරන්නේ යම් විෂයක් පිළිබඳ වියුක්ත අවබෝධය නොව, බල ව්‍යුහයන් විසින් නිර්මාණය කරනු ලබන, සමාජය මත ආරෝපණය කරනු ලබන බලයේ ම ප්‍රකාශනයක් වන දැනුම යි. ඒ අනුව මෙය සමාජය තුළ ස්ථාපිත කිරීමේ මාධ්‍යය වන්නේ

[6] මිචෙල් ෆූකෝට අනුව, නිරපේක්ෂ සත්‍යය ලෙස යමක් නොමැති අතර සත්‍යය ලෙස අප පිළිගන්නා සෑම දෙයක්ම බලය සමඟ සම්බන්ධ වී නිර්මාණය වේ (Foucault, 1979).

භාෂාව බව ෆූකෝ දක්වයි (උයන්ගොඩ, 1995ඃ 59). එනම් පශ්චාත් ව්‍යූහවාදීන් දක්වන භාෂාවේ, වචනයට ඔබ්බෙහි වූ අර්ථය යන්න මින් හැඟවේ. එම භාෂාව බලයේ ප්‍රකාශනයක් වන අතර, අප ලොව දකින්නේ සමාජය තුළ පවතින බලාධිකාරය මඟින් අර්ථකථනය කරන ලද භාෂාවකිනි. එනම්, අප සියලු දේ සිදු කරනුයේ බලය විසින් සකස් කරන ලද භාෂාවක් හරහා ය. මෙම භාෂාව ප්‍රකාශයට පත් වන්නේ කතිකාව හරහා ය. ඒ අනුව, බලය-දැනුම-සත්‍ය යන අංශයන් එකිනෙක සම්බන්ධ කෙරෙනුයේ කතිකාව හරහා බව ෆූකෝ දක්වයි (Ranke, 2014: 04).

සරලව ගතහොත් කතිකාව යනු, එක් එක් යුගවල දී දැනුම අර්ථ ගැන්වූ ආකාර සම්බන්ධ විශ්ලේෂණයකි. ෆූකෝ දැනුම කතිකාවක් ලෙස හඳුනාගත් අතර, බලයද කතිකාවක් ලෙස හඳුනාගනී. ඉන්පසු මෙම ද්විත්වය එක් කොට ‘දැනුම-බලය කතිකාව’ ලෙස එක් කතිකාවක් වශයෙන් විශ්ලේෂණ සඳහා උපයුක්ත කරගනී. එය පහත සටහන ඔස්සේ තවදුරටත් විස්තර වේ. ඒ අනුව දැනුම සහ බලයේ කතිකාමය ගොඩනැගීම ඔහු විසින් ඔහුගේ ශාස්ත්‍රීය ග්‍රන්ථයන්හි දී අනුක්‍රමිකව වටහාගන්නා ආකාරය පහත පරිදි දැක්විය හැකි ය.

- Madness of Civilization (1961) - දැනුම ඇති මිනිසුන් බලය හසුරුවන බව
- The Order of Things (1966) - දැනුමේ ව්‍යූහය සහ එහි පිළිවෙළ ස්ථාපිත වන ආකාරය
- The Archeology of Knowledge (1969) - දැනුම හා පුද්ගලයා අතර සම්බන්ධය පිරික්සීම
- The Birth of the Clinic (1973) - දැනුමේ මූලාශ්‍රය සෙවීම

- The History of Sexuality/ Vol. 1 (1976) - බලය ප්‍රචණ්ඩත්වය ඉස්මතු කරන්නා වූ පාලනය කිරීමේ ආකාරයක් වශයෙන්
- Discipline and Punish (1977) - දැනුම බලය සමඟ සම්බන්ධ කිරීම
- Power – Knowledge: Selected Interviews and Other Writings (1980) - බලය-දැනුම ඔහුගේ පර්යාලෝකයෙන් සාකච්ඡා කිරීම
- The History of Sexuality/ Vol. 2 (1987) - බලය, දැනුම සහ වින්දනය අතර සම්බන්ධතාවය විශ්ලේෂණය
- The History of Sexuality/ Vol. 3 (1990) - ග්‍රීසිය සහ රෝම ශිෂ්ටාචාරයන්හි ලිංගිකත්වයේ ස්වරූපය බලයේ මානයෙන් පිරික්සීම

**දැනුම, බලය සහ සත්‍යය කතිකාවන් වශයෙන්**

දෝෂි (2008) සඳහන් කරන ආකාරයට, මිචෙල් ෆූකෝ පශ්චාත් නූතනත්වය සංකල්ප දෙකක් ඔස්සේ නිර්වචනය කර තිබේ. ඒවා නමින්, කතිකාව සහ බලය යි. ඔහු කතිකාව නිර්වචනය කළ ආකාරය ඔහුගේ වචනයෙන් ම පහත දැක්වේ.

*"මා දකින ආකාරයට කතිකාව යනු, මීට පෙර ස්ථාපිත කරන ලද සංස්ලේෂණයක වාචික පරිවර්තනයකි, එම පරිවර්තනයක සංසිද්ධි ප්‍රකාශනයකි, එසේත් නැතිනම් මා දකින්නට කැමැති විවිධ තත්ත්වයන්ගේ ක්ෂේත්‍ර නියමයන්ගේ සම්බන්ධතාවයන්ය" (Foucault, 1972: 55).*

ඒ අනුව, කතිකාව වනාහි සමාජ ජීවිතයේ කිසියම් වපසරියක් තුළ ගොඩනගන චින්තන රාමුවක් යැයි ඔහු දක්වා සිටියේ ය. උමතු බව පිළිබඳ කතිකාව සමාජය තුළ විවිධ කාල වකවානු තුළ ගොඩනැගුණු ආකාරය පිළිබඳ ෆූකෝ විසින් සිදු කරන ලද විග්‍රහය තුළින් මෙය වඩාත් පැහැදිලි වේ. උමතුභාවය යන්න මිනිසුන් විසින් අර්ථකථනය කළ

ආකාරය සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය මත අප එය තේරුම් ගනු ලැබේ (මෙය තවදුරටත් දැනුමේ පුරාවිද්‍යාව කොටසේ දී සාකච්ඡා කර ඇත).

කතිකාව හරහා බලය ක්‍රියාත්මක වන ආකාරය ඔහු විස්තර කර තිබෙන හෙයින්, බලය-දැනුම සම්බන්ධ උක්ත අර්ථගැන්වීමෙන් කතිකාව සම්බන්ධ සාකච්ඡාව විතැන් කළ නොහැකි ය. දැනුම බලය බවට පත්වීමත්, බලය දැනුම බවට පත්වීමත් යන ද්විත්ව ආකාරය ම සිදු වන්නේ මූලික ව ම කතිකාව ඔස්සේ ය. අනෙක් අතට දැනුමට තනි ව ක්‍රියාත්මක වීමට නොහැකි තැන් පශ්චාත් නූතන ලෝකය තුළ බොහෝ දුරට හමුවන්නේ, කතිකාව හරහා එය ක්‍රියාත්මක වුවහොත් පමණක් එයට බලය ලැබෙන හෙයිනි. උදාහරණ වශයෙන්, ආපදා අනතුරු ඇඟවීම් සම්බන්ධ තාක්ෂණික දැනුම ඇති පුද්ගලයා එම දැනුම තුළින් යම් උපද්‍රවයක් සම්බන්ධයෙන් සාක්ෂ්‍ය සහිත පූර්ව හඳුනාගැනීමක් සිදු කළ හැකි ය. එම පුද්ගලයාට තමා සතුවන විශේෂීකරණය වූ දැනුම තුළින් අන් අයට සාපේක්ෂ ව බලයක් ලැබෙන නමුත්, එය සමාජය වෙත ගෙනයාමේ බලය නෛතික ව ඇත්තේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට යි. එම නෛතික බලය පැවතිය ද සමාජය තුළ ඒ සම්බන්ධ කතිකාවක් ගොඩනැගීමට සමාජීය වශයෙන් බලය ඇත්තේ මාධ්‍ය ආයතනයන්ට ය. ඒ අනුව දැනුම තිබූ පමණින් එය කතිකාවක් බවට පත් කිරීමට නොහැකි බවත්, දැනුම තුළින් පුද්ගලයාට අත්‍යන්තයෙන් ලැබෙන බලය සෑම විටම ස්වාධීන ව බලාත්මක කළ නොහැකි බවත්, බලය (නෛතික) තිබූ පමණින් එය කතිකාවක් කළ නොහැකි බවත්, එය සමාජමය වශයෙන් ගොඩනැගුණු බලයක් සහිත පාර්ශවයකට කළ හැකි බවත් මේ තුළින් පෙනී යයි.

ඒ අනුව දැනුම - බලය කතිකාව හරහා සෑම විටම ෆූකෝ උත්සාහ කරනු ලැබුවේ සමාජයේ සත්‍යය සොයා යාමට ය (Foucault

and Rainbow, 1991; Foucault, 1790). පෙර දී ද සඳහන් කළ ආකාරයට නිරපේක්ෂ සත්‍යයක් පිළිබඳව විශ්වාස නොකරන ඔහු දක්වන ආකාරයට, දැනුම බලයක් වූවත්, අප තුළ දැනුම තුළින් සත්‍යය පිළිබඳ නිසි අවබෝධයක් ගොඩනැගී තිබේ ද යන්න ගැටලු සහගත ය. එසේ නම් සත්‍යවාදියෙකු වශයෙන් ෆූකෝ පෙන්වා දෙන්නේ අපගේ දැනුම ඵලදායී වීමට නම්, එය බලය බවට සැබෑවට ම පත් වීමට නම්, අප සත්‍යය සෙවීමට උත්සුක විය යුතු බව යි (දෝෂි, 2008ඃ 23-24). කෙසේ නමුත් පශ්චාත් නූතනවාදය තුළ (උදාඃ බෝද්‍රියාගේ ආභාෂණය පිළිබඳ විග්‍රහය) දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ, සමාජය තුළ සත්‍යය ලෙස දෙයක් නොමැති බවත්, ව්‍යාජ යථාර්ථ බහුල වන බවටත් වන පිළිගැනීමයි. කෙසේ නමුත් කතිකාමය ගොඩනැගීම් තුළින් තත්කාලීන ව සත්‍යය ගවේෂණය කිරීමට බලය-දැනුම දාර්ශනික වශයෙන් මෙන් ම ප්‍රායෝගික වශයෙන් ද උපකාරී වන බව ෆූකෝගේ විශ්වාසය විය.

> *"ඒ ඒ ප්‍රදේශවලට, ඒ ඒ සන්දර්භයන්ට, ඒ ඒ සමාජ තත්ත්වයන්ට ආවේණික වූ බල සම්බන්ධතාවල ක්ෂුද්‍ර දේශපාලනය වෙත සමීප බැල්මක් හෙලන විට, අපට නිගමනය කළ හැක්කේ දැනුම-කතිකාව යන පද්ධති අතර සමීප, සුහද සම්බන්ධතාවක් පවතින බවයි" (Foucault, 1994, q.f. Bruchell, 1966).*

ඒ අනුව දැනුම, බලය සහ සත්‍යය එකිනෙකාට සම්බන්ධ වන්නේ කතිකාව හරහා බව පැහැදිලි වේ. ඒ අනුව කතිකාවන් ඇතිවීම සඳහා බලපාන ප්‍රධාන ම සාධකය බලය වන අතර, කතිකාවන් සත්‍ය වූවත් නොවූවත් කතිකාවන් ගණනාවකින් සමාජය සමන්විත වේ. මෙහි දී පවතින විශේෂත්වය වන්නේ, මෙම කතිකාවන් ගොඩනැගීමේ බලය භාෂාව සතු වීම යි. ව්‍යුහවාදී ආභාසය ලත් ෆූකෝ, පශ්චාත් ව්‍යුහවාදී

තර්කනය තුළ ද භාෂාවේ ආභාස ය, කතිකාව තුළ මූලික තැනක් ගන්නා බව පෙන්වා දේ. ඒ අනුව, කතිකාව හරහා ලෝකය දෙස බැලිය හැකි බව දක්වන ෆූකෝ, එකිනෙකට වෙනස් කතිකාවන් ගණනාවක් සමාජය තුළ පවතින බව පෙන්වා දේ. සරලවම කිවහොත් ෆූකෝ සියලුම දේ දකින්නේ කතිකාවන් වශයෙන් වන අතර, ඒ තුළ සෑම විටම දැනුම - බලය පවතී. ඒ අනුව ලොව මිනිසුන් තම සිතිවිලි පදනම් කරගෙන ශාස්ත්‍රීය කඳවුරු ආරම්භ කරගනී. උදාහරණ වශයෙන්, පීටර් බර්ජර් සහ තෝමස් ලක්මාන් දක්වන ආකාරයට සමාජීය යථාර්ථය නිර්මාණය කරනුයේ මිනිසුන් විසින් ය. දෙයක් අවදානම් ලෙස දකින්නටත්, තවත් දෙයක් අවදානමක් රහිත ලෙස දකින්නටත් මිනිසුන් පෙළඹෙන්නේ එය සමාජීය වශයෙන් නිර්මාණය වන ආකාරය අනුව ය (Berger and Luckmann, 1966). වෙනත් ආකාරයකින් කිවහොත්, එය සිදුවන්නේ ඊට අදාළ ව සමාජය තුළ නිර්මාණය වන කතිකාවට අනුව යමිනි. ඒ අනුව කතිකාව බහු ආංශික බලපෑම් ලත්, බලයක් සහිත, දැනුමේ වාහකයක් වශයෙන් කටයුතු කරන බව පැවසීම සාධාරණ වේ.

> *“Unpowering the relationships among the social institutions practices of knowledge that come to be produce particular kind of discourse or structure of thought”(Foucault, 1972: 167).*

ෆූකෝගේ මෙම ප්‍රකාශයෙන් ගම්‍ය කරනුයේ, සිතුවිල්ලේ ව්‍යූහය කතිකාව වන බව යි. එහි ලා දැනුම සෑම විට ම සිදු කරනුයේ මානව සම්බන්ධතා නම් ආයතන, මානව සිරිත් - විරිත්, දැනුමේ තිබෙන දේ ඉවත් කර බැලීම වේ. එනම් ඉගෙනගත් දේ බැහැර කර ඒ දෙස බැලීම වේ. ඒ තුළ බලය පිළිබඳ කතිකාව ඉස්මතු කෙරෙන අතර, කතිකාවන් ගණනාවක සම්මිශ්‍රණයක් තුළ අදහස්වල ව්‍යුහයක්, භාෂාවේ යම් අකාරයකින් නිමග්න ව පවතී.

යම් කාල වකවානුවක් තුළ යම් දැනුමක් මඟින් ගොඩනැගෙන බලය මඟින් ඉස්මතු වන කතිකාවක් ඔස්සේ අපව පාලනය කෙරෙන බව මින් අදහස් කෙරේ. ඉදිරියේදී ෆූකෝගේ ජෛව දේශපාලනය යන අදහස ඔස්සේ සාකච්ඡා කෙරෙන, වෛද්‍යමය කතිකාව හරහා අපගේ ආහාර පුරුදු ආදිය පාලනය කරන ආකාරය මීට හොඳ ම නිදසුන වේ. නමුත් ඒ තුළ විවිධ මට්ටම්වල වෛද්‍යමය කතිකාවන් පවතී. ඒවා තුළින් භාෂාව හරහා විවිධ යථාර්ථ නිර්මාණය කරගෙන තිබේ. උදාහරණයක් ඇසුරින් මෙය පැහැදිලි කළහොත්, ලාංකේය සමාජය තුළ කාන්තාවකගේ ඔසප් කාලය තුළ ඇය ආහාරයට ගත යුතු විශේෂ ආහාර, දින චර්යාව ගත කළ යුතු ආකාරය සම්බන්ධ යම් සාම්ප්‍රදායික ප්‍රමිතීන්ගෙන් සමන්විත කතිකාවක් පවතින අතර, ඒ සම්බන්ධ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ ද යම් කතිකාවක් පවතී. බටහිර වෛද්‍ය ක්‍රමය තුළ මෙය සම්බන්ධ විශේෂිත රීති නොදක්වමින් එය සාමාන්‍යකරණය කරන අතර, ඒ හරහා වෙනස් ආකාරයෙන් ඔසප් වීම හා සම්බන්ධ ශාරීරික ගැටලු "රෝගී තත්ත්ව ලෙස" (උදා: PMS- Pre-Menstrual Syndrome) හැඳින්වීම සිදු කරයි (පිණිකහන, 2012). එකිනෙකට වෙනස් කතිකාවන් ගණනාවක්, එකිනෙකට වෙනස් දැනුම් පද්ධතීන් තුළින් ගොඩනැගී තිබෙන බව මේ තුළින් පෙනී යන අතර, එම අර්ථ ගැන්වීම් බලය සහිත වීමට අදාළ සමාජ සන්දර්භය තුළ පවතින අවශේෂ සාධකවල බලපෑම ද පවතී. එය ඒ හා සම්බන්ධ තවත් කතිකාවක් වන අතර, මෙයට අදාළ ව ගතහොත් ධනේශ්වර අර්ථ ක්‍රමය තුළ බටහිර වෛද්‍ය කතිකාව බල සහිත කරවීමක් සිදු කෙරේ. ඒ අනුව කතිකාව, දැනුම, බලය එකිනෙක තදින් බැඳී පවතින අතර, එය සමාජය තුළ යම් පරස්පර විරෝධී මතවාද නිර්මාණය වීමට, ප්‍රතිරෝධතා සහිත ව ක්‍රියාත්මක වන බව පැහැදිලි වේ. එසේම, එක් කතිකාවක පැවැත්ම තවත් කතිකාවක පැවැත්ම අතික්‍රමණය නොකරන අතර, එසේ සිදු වන්නේ ඒවා එක ම බල

ජාලාවක කොටස් වන හෙයින් බව ෆූකෝ උපුටා දක්වමින් Escobar (1984) විසින් ද දක්වා තිබේ.

> *"The relations of power themselves cannot be established, consolidated nor implemented without a production, accumulation, circulation and functioning of a discourse" (Foucault, q.f. Ranke, 2014: 04).*

ඒ අනුව ඉතිහාසයේ යම් අවස්ථාවක දී කතිකාව නිර්මාණය වේ. එහි ලා බලය ක්‍රියාත්මක කිරීමේ විශ්වීය සත්‍යය තුළින් කතිකා නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ. ෆූකෝ සිය "Regimes of Truth" යන ආස්ථානය මඟින් සමාජයේ සත්‍ය පිළිබඳ ව තවදුරටත් සාකච්ඡා කරයි. ඒ අනුව ෆූකෝ දක්වන ආකාරයට, අපගේ සමාජය හා සත්‍යය නිර්මාණය කිරීම සෑම විට ම දේශපාලන සහ ආර්ථික ප්‍රෝත්සාහයන් සමඟ සම්බන්ධ වේ (Foucault, 1996: 198). මෙම අදහස ඉහත දැක්වූ උදාහරණය ඔස්සේ තවදුරටත් සනාථ කරවයි.

**බලය පිළිබඳ ෆූකෝගේ අර්ථ ගැන්වීම**

බලයෙහි පැවැත්ම, එහි වැදගත්කම පිළිබඳව මැකියාවෙලීගේ " කුමාරයා" කෘතිය හරහා ඇරඹි සාකච්ඡාව යුග ගණනාවක් වෙනස් වෙමින්, යාවත්කාලීන වෙමින් පැවති බව අප දන්නා කරුණකි. එසේ වන්නේ බලයේ ඇති සර්වකාලීන බව සහ එය ඒ හා සම්බන්ධ කතිකාවන් සමාජය තුළ විවිධ ශාස්ත්‍රීය ධාරා ඔස්සේ සාකච්ඡා කෙරෙන හෙයිනි. කෙසේ නමුත්, මින් පෙර දැක්වූ ආකාරයට ම නව සමාජ විද්‍යාවේ පියා වශයෙන් මැක්ස් වෙබර් විසින් ඉදිරිපත් කළ බලය පිළිබඳ ප්‍රචලිත නිර්වචනයෙන් ඔබ්බට යමින්, එහි ආභාසය ලත් මිචෙල් ෆූකෝ බලය වෙනස් ආකාරයෙන් නිර්වචනය කරයි. ඒ අනුව දැනුම - බලය

සාකච්ඡාව තුළ බලය අන්තර්ගත කිරීමෙහි ලා ඔහු බලය හඳුනාගත් ආකාරය සුවිශේෂී ව දැක්වීම වැදගත් වේ.

මිචෙල් ෆූකෝ විසින් පුළුල් වශයෙන් හඳුනාගත් කාරණයක් වන්නේ සමාජය පාලනය කිරීමේ ආකාරයක් වශයෙන් බලය න්‍යායගතකරණය කිරීම බොහෝ පර්යේෂකයන්ගේ අවධානය යොමු විය යුතු කාරණයක් වන බවයි (Foucault, 2003). එසේ ම බලය පිළිබඳ පුළුල් සාකච්ඡාවක් සිදු කරන ඔහු (1990) වරක් ප්‍රකාශ කර තිබෙන කාරණයක් වන්නේ, තම බලය පිළිබඳ සංකල්පගතකරණය බොහෝ දුරට දෙගිඩියාවකින් යුතු වූවක් වන බව යි. මෙය තවදුරටත්, ෆූකෝ පිළිබඳ ව සාකච්ඡා කරන ශාස්ත්‍රඥයින් (උදා: Simon, 1994; Crampton & Elden, 2007; Legg, 2011) විසින් ද පෙන්වා දී තිබේ. Gallagher (2008: 395) ට අනුව, බලය දෙගිඩියාවකින් යුතු දෙයක් ලෙස මෙන් ම, පොරොන්දුවලින් පිරුණු සහ භයානක දෙයක් වන අතර, පාලනය සහ ප්‍රතිරෝධය යන දෙආකාරයෙන් ම දැකගත හැකි සාකච්ඡාවකි.

> *"'What is Power?' is obviously a theoretical question that would provide an answer to everything, which is just what I don't want to do" (Foucault, 2003: 13).*

ෆූකෝ විසින් දැක්වූ ඉහත ප්‍රකාශයෙන් සනාථ වනුයේ ඔහුට බලය හැඳින්වීමේ උනන්දුවක් නොපැවති බව යි. නමුත් ඔහු බලය පිළිබඳ විග්‍රහ කිරීමක් සිදු නොකරන බවක් ඉන් අදහස් නොවේ. එනම් ඔහු බලය සාර්ව මට්ටමින් හඳුනාගැනීමට තැත් නොකළ අතර, ඒ වෙනුවට ක්ෂුද්‍ර මට්ටමින් බලය දැනුම සමඟ දක්වන සම්බන්ධතාව ය සෙවීම ක්‍රම ක්‍රමයෙන් සිදු කළ බව කිව හැකි ය. උදාහරණ වශයෙන්, "උමතුව හා ශිෂ්ටාචාරය" (Madness and Civilization - 1966) කෘතිය හරහා ඔහු උමතුභාවය පිළිබඳ උනන්දු වූයේ නැත. ඒ වෙනුවට ඔහු සිදු කළේ,

උමතුභාවය හා සම්බන්ධ වී තිබෙන දැනුම් මූලාශ්‍රය වන මනෝ චිකිත්සාව පිළිබඳ දැනුම සෙවීම යි.

ඒ අනුව ෆූකෝගේ බලය පිළිබඳ හැදෑරීමේ ප්‍රවේශයේ ක්‍රමවේදාත්මක මූලධර්ම කිහිපයක් හඳුනාගත හැකි අතර, ඒ තුළින් ෆූකෝ දක්වන බලයේ මූලිකාංග විද්‍යමාන වේ. ඒවා සැකෙවින් පහත ඉදිරිපත් කෙරේ.

## a. බලය යනු ක්‍රියාවන් මත යෙදෙන ක්‍රියාවන් ය (Power is Actions over Actions).

ෆූකෝ සිය ශාස්ත්‍රීය ජීවිතයේ පසුකාලීන අවධිය වන විට බලයට යම් ආකාර වූ සාමාන්‍ය නිර්වචනයක් ලබාදේ. එනම්,

“බලය යනු අනෙකා මත ඍජු ව සහ ඉතා ඉක්මනින් ක්‍රියාත්මක නොවන ආකාරයේ ක්‍රියා මාදිලියකි. අනෙකා මත ඉක්මනින් ක්‍රියාත්මක වීම වෙනුවට ක්‍රියාවන් මත එය ක්‍රියාත්මක වේඃ ක්‍රියාවක් මත ක්‍රියාවක්, එනම්, එය පවතින ක්‍රියාවක් මත, මතුවිය හැකි ක්‍රියාවක් මත, වර්තමාන ක්‍රියාවක් මත හෝ අනාගතයේ ඇතිවිය හැකි ක්‍රියාවක් මත ක්‍රියාත්මක විය හැකි ය. එය, පෙළඹවීම, මඟ හැරීම හෝ වඩාත් පහසු හෝ වඩාත් දුෂ්කර තත්ත්ව ඇති කළ හැකි අතර, අතීතයේ දී එය බලහත්කාරයෙන් හෝ සම්පූර්ණයෙන් ම සැඟවී පැවති දෙයක් විය හැකි ය” (Foucault, 1983: 221).

ඒ අනුව ෆූකෝ එක් බලයක් පිළිබඳ ව නොව, බලයන් පිළිබඳ ව සිතීමට අපව පොළඹවයි. මෙය Gallagher (2008) උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරයි. එනම්, ගුරුවරුන් ළමුන් මත යොදන බලය සහ ළමුන් ගුරුවරුන්ගේ ඉල්ලුමට ප්‍රතිරෝධීව යොදන බලය සමාන නොවේ. මෙම දෙආකාරයේ ම බලයන් විදුහල්පතිවරයාගේ බලයට වඩා වෙනස් වේ. බලය වෙනස් වන්නා සේ ම බලය යොදන ආකාරය ද වෙනස් වේ

(Gallagher, 2008: 398). ඒ අනුව ක්‍රියාවක් මත ක්‍රියා කරන බල ප්‍රභේද රාශියක් පවතින බව ෆූකෝ පෙන්වා දේ.

ෆූකෝ (1979: 93) දක්වන ආකාරයට, බලය සෑම ස්ථානයක ම පවතී. නමුත් ඔහු පිළිගැනීමට අකමැති කරුණක් වූයේ, 'එක් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් අත බලය පවතී ය' යන්න යි. මේ ඔස්සේ 'බලය' පන්තිමය නිර්මාණයක් වශයෙන් වන මාක්ස්වාදී විග්‍රහය නිශේධනය කරයි. ඔහුට අනුව, "බලය යනු අත්කරගත හැකි, අල්ලාගත හැකි හෝ බෙදාගත හැකි දෙයක් නොවේ. එය කෙනෙක් වරක් දරා සිටින දෙයක් මෙන් ම, එක්වර ම එම පුද්ගලයා තුළින් ගිලිහී යා හැකි දෙයකි. සමාජයේ ජංගම සම්බන්ධතා සහ සමනතාවාදී අන්තර් ක්‍රියාකාරීත්වයෙන් අප්‍රමාණ අංග ගණනාවකින් බලය ක්‍රියාත්මක වේ" (Szeman and Kaposy, 2011: 135). එය ෆූකෝගේ පහත ප්‍රකාශයෙන් තවදුරටත් තහවුරු වේ.

> *Power must be analysed as something circulates, or rather as something which only functions in the form of chain" (Foucault, 1980b: 98).*

එනම්, ෆූකෝට අනුව, බලය යම් දාමයක ආකාරයක් වශයෙන් ක්‍රියාත්මක වනවාට වඩා සංසරණය වන දෙයක් වශයෙන් විශ්ලේෂණය කළ යුතු වේ. බලය මෙහි හෝ වෙනත් තැනක ඒකරාශී කිරීම කිසිදු දිනක කළ නොහැකි අතර, කිසිවෙකුත් අත එය නොපවතී. එසේ ම එය භාණ්ඩයක් හෝ ධනයක කොටසක් වශයෙන් කිසිදාක අත්පත් කරගත නොහැකි ය. බලය ක්‍රියාත්මක කළ හැක්කේ දාමයක් වැනි ආකාරයක් තුළින් පමණි (Foucault, 1980b: 98).

බලය ඇති තැන ප්‍රතිරෝධය පවතින බවත්, ප්‍රතිරෝධය තුළින් බලය ඇතිවන බවත් මෙයින් තවදුරටත් ධ්වනිත වේ. බලය ක්‍රියාවන් මත යෙදෙන ක්‍රියාවන් වන බැවින් ඒ තුළ ප්‍රතිරෝධය නිරන්තරයෙන්ම පවතී.

එහි ප්‍රතිඵල වශයෙන් යමක් සැම අවස්ථාවක දී ම බලය තුළ පවතී. එසේම, කිසිදු දෙයකට බලයෙන් මිදිය නොහැකි ය. ඒ අනුව බලයෙන් පරිබාහිර වූ නිශ්චිත ස්ථානයක් නොමැත. ඊට හේතු ලෙස, "නීතියේ පදනම ලෙස බලය පැවතීම" විචාර බුද්ධියේ ප්‍රයෝගය ලෙස ඉතිහාසයත්, ඉතිහාසයේ ප්‍රයෝගය බවට බලයත් පත්වීම, ආදිය පමණක් දැකීම ගත හැකි ය. නමුත් බල ජාලයේ සැම අවස්ථාවක දී ම හුදෙක් බලය පමණක් නොව ඊට එරෙහි ව ඉදිරිපත් වන ප්‍රතිරෝධය ද හඳුනාගත හැකි ය (Szeman and Kaposy, 2011: 135).

**b. කුඩා ම පරාසයකින් ආරම්භ වේ.**

මේ ඔස්සේ බලය පිළිබඳ ක්ෂුද්‍ර මට්ටමකින් විමසීම පිළිබඳ නැවත වරක් සනාථ කරයි. ඒ අනුව, ෆූකෝ අවධාරණය කරන ආකාරයට, සමාජ ධුරාවලියේ ඉහළ සිට පහළට ගමන් කරන්නා වූ දෙයක් වශයෙන් බලය හඳුනාගත නොහැකි ය. එනම්, එය රාජ්‍යයේ සිට ප්‍රජාවටත්, ධනපතීන්ගේ සිට නිර්ධනයයන්ටත් ආදී වශයෙන් යටිකුරු දිශානතියක් සහිත ව ක්‍රියාත්මක වන්නක් නොවන බව යි.

"කෙනෙක් බලයේ ආරෝහණ ආකාරය පිළිබඳ විශ්ලේෂණය කිරීමට වඩා එහි ඉතා කුඩා යාන්ත්‍රණයන්ගෙන් ආරම්භ කළ යුතු ය. මෙම කුඩා යාන්ත්‍රණයන්ට ඒවායේ ම ඉතිහාසයක්, ඒවායේ ම ගමන් පථයක්, ඔවුන්ගේ ම තාක්ෂණික ක්‍රමවේද සහ උපායමාර්ග පවතින අතර, මෙම බල යාන්ත්‍රණයන් කෙසේ පැවතියේ ද යන්න ඒවා දිගින් දිගටම ක්‍රියාත්මක වූ ආකාරය, ආයෝජනය කළ, පිහිටවූ, යොදාගත්, ක්‍රමානුකූල, ප්‍රවේශ වූ, පරිවර්තනය වූ, වෙනත් දෙයක් මඟින් අහිමි කළ, පුළුල් කළ ආදී වශයෙන් සාමාන්‍ය යාන්ත්‍රණ මඟින් හා ගෝලීය ආධිපත්‍යයේ ආකාර මඟින් බලය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න බැලිය යුතු ය" (Foucault, 1980b: 99).

මේ ආකාරයෙන් බලය අවස්ථානුකූලව ක්‍රියාත්මක වන දෙයක් පමණක් නොවන බවත්, රජයේ හෝ බහු ජාතික සමාගම්වල මූල්‍යාමය අධිකාරීත්වය යටතේ බලය හා සම්බන්ධ විශාල තීරණ ගන්නා බවත් වටහාගත හැකි ය. බලය යනු ක්‍රියාවන් මත යෙදෙන ක්‍රියාවන් නිසාවෙන් එදිනෙදා කටයුතුවල දී ලෞකික තත්ත්වයන් ද බලයට නතුවන බව මේ හරහා ෆූකෝ පෙන්වා දේ (Gallagher, 2008: 400).

**c. බලය අරමුණු සහගත ව ක්‍රියාත්මක වේ.**

ෆූකෝට අනුව, අරමුණු සහ ඉලක්ක සපුරාගැනීමට නිරන්තරයෙන් ම බලය ක්‍රියාත්මක වන අතර, බලය නිරන්තරයෙන් ම එම අරමුණ සහිත වේ. තනි විෂයේ තීරණ හෝ තෝරාගැනීම්වල ප්‍රතිඵල ඒ මඟින් අදහස් නොවේ (Foucault, 1979). වෙනත් ආකාරයකින් කිවහොත්, ඔවුන්ගේ ක්‍රියාවල ප්‍රතිඵලවල ඒකාධිකාරයක් බලය යොදන්නාවූ පුද්ගලයින්ට නොමැත. ඇතැම් අවස්ථාවන්හි දී මෙම ක්‍රියාවල ප්‍රතිඵල එකිනෙකා අතර යම් සම්බන්ධතාවයක් පෙන්විය හැකි සේම, එකිනෙකා අතර ඍජු ලෙස සට්ඨනකාරී වීම ද සිදුවිය හැකි ය.

ඒ අනුව බල සම්බන්ධතාවයන් වාස්තවික නොවන, අරමුණු සහගත ව ඇතිවන ඒවා ය. අරමුණක් සහ ඉලක්කයකින් තොරව ඇතිවන බලයක් නොමැත. නමුත් තනි වස්තුවක තීරණ හෝ තෝරාගැනීම් මත මෙය ඇතිවන බවක් කිව නොහැකි ය (Szeman and Kaposy, 2011: 155). මෙයට උදාහරණ වශයෙන් Szeman සහ Kaposy (2011) දක්වන්නේ, පාලනය ගෙනයනු ලබන පිරිස/ රටක ආර්ථික තීරණ ගනු ලබන පිරිස සමාජයේ සම්පූර්ණ ක්‍රියාකාරීත්වය තීරණය කරනු ලබන බල ජාලාව වන බව යි.

**d. බලය රාජ්‍යය ලෙස පමණක් හඳුනාගැනීමේ ගැටලු සහගත බව**

ෆූකෝගේ ශාස්ත්‍රීය ජීවිතයේ පසුකාලය වන විට ඔහු " පාලනත්වය" (Governmentality) යන සාකච්ඡාව පිළිබඳ ව ශාස්ත්‍රීය විග්‍රහයක නිරත වීමට උත්සුක විය (Foucault, 1992). ඊට හේතුව වූයේ 1970 දශකයේ දී මූලික ව ම රාජ්‍යය විසින් ගෙන ගිය සුභසාධනවාදී සාකච්ඡාවට වඩා බලය හඳුනාගන්නා ආකාරය වඩාත් සියුම් වෙනසක් සහිත වීම යි. ඔහු එම යෙදුම මඟින් පුළුල් වශයෙන් අර්ථ ගැන්වූයේ " බලය" යෙදවීම හරහා පවුල, පාසල, පල්ලිය හා ජාතික ජනගහනයේ ප්‍රජාව පාලනය කිරීමේ කාර්යය සම්බන්ධයෙනි. ෆූකෝ ප්‍රකාශ කරන පාලනත්වය මඟින් එක් පක්ෂයක (ධනපතීන්, රාජ්‍ය, සේවාදායකයා, ගුරුවරයා) කැමැත්ත බලහත්කාරයෙන් අනෙකා (නිර්ධනයා, ප්‍රජාව, සේවකයා, ශිෂ්‍යයා) මත ක්‍රියාත්මක කිරීමක් නොහඟවයි. ඒ වෙනුවට, වඩාත් සියුම් අභ්‍යන්තර ක්‍රියාකාරීත්වයක් ධූරාවලිගත, පාලකයාගේ බලහත්කාරී බලය අනෙකා මත පැනවීමේ, පාලිතයා තමා විසින් ම තමා මත පනවාගැනීමේ ක්‍රමයක් සහිත ස්වයං පාලනයක් ඒ තුළ පවතී. එනම් ස්වයං විනයක් මඟින් පුද්ගලයා තමාව ම පාලනය කරගැනීමේ ක්‍රමයකි. මෙය තුන්වන ලෝකයේ උදාහරණයක් ඇසුරින් විමසීම සිදු කළ හැකි වේ. අධිරාජ්‍යවාදීන් විසින් තුන්වන ලෝකය ශිෂ්ට කිරීමට පාලනත්වය භාවිත කරන ලදුව තුන්වන ලෝකයේ කතිකාව නිර්මාණය වී ඇත. අධිරාජ්‍යවාදය ආයතනගත කරන ලදුව ශික්ෂිත ආකාරයට ප්‍රජාව පාලනය කිරීමේ ක්‍රියාවලිය සිදු වූ අතර, විනය, අපරාධ ආදී කතිකාවන් හරහා ප්‍රජාව තුළ ස්වයං පාලනයක් ඇති කරවීම තුළින් ඔවුන්ව පාලනත්වය තුළට අන්තර්ග්‍රහණය කරගැනීම සිදු ව ඇත. වඩාත් ශිෂ්ට වූ විවාහ ක්‍රමය කුමක් ද යන්න හෝ ලිංගිකත්වය සහ ව්‍යභිචාරය සම්බන්ධයෙන් පොදු මතය කුමක් ද යන්න ආදී වූ සංස්කෘතිය හා සම්බන්ධ වූ තුන්වන ලෝකයේ කතිකාවන් පාලනත්වය ඔස්සේ

අධිරාජ්‍යවාදී සහ යටත්විජිතවාදී අවශ්‍යතා මත හැඩගැසීම සිදු වන්නේ ඒ අයුරිනි.

Bruchell (1966: 20) දක්වන ආකාරයට, තනි පුද්ගලයාට තමාව ම පාලනය කරගැනීමට හැකි තත්ත්වයට පත් කිරීමට රජය විසින් බලපෑම් කිරීමේ ආකාරය ලෙස මෙම 'ආණ්ඩුව' සාමාන්‍යයෙන් හඳුනාගත හැකිය ("Government in general is understood as a way of acting to affect to affect the way in which individuals conduct themselves" - Bruchell). මේ ආකාරයට තනි පුද්ගලයා තමාව ම පාලනය කරගැනීමට හැකියාව වර්ධනය කිරීම මඟින් රාජ්‍ය බලය භාවිතයෙන් එම පුද්ගලයාට ස්වාධීන කාරකයෙකු බවට පත්වීමට, සමාන අවස්ථාවක් ලද රෙගුලාසි වලට යටත් බවින් නිදහස් කරවයි.

මෙම සන්දර්භය තුළ බල යාන්ත්‍රණයක් හඳුනාගත හැකි වේ. මේ අනුව, බල සම්බන්ධතාවන්හි මූලයෙහි පාලකයන් සහ පාලිතයින් අතර කිසිදු ද්විපාර්ශ්වීයභාවයක් නොමැත. එබැවින් අප විශාල කාලයක පටන් දේශපාලන චින්තනයේ කේන්ද්‍රීය වූ නීතිය - ස්වාධිපත්‍ය සහිත පද්ධතියෙන් මිදේ. එබැවින් මෙහි දී බලය නිර්මාණය කිරීම උදෙසා රාජ්‍ය ස්වාධිපත්‍ය සහිත අධිකාරිය ලෙස උපකල්පනය නොකළ යුතු අතර, ඒ ආකාරයෙන් ම නීතියේ ආකාරයක් ලෙස, දෙන ලද මූලයක් පුරා ආධිපත්‍ය පතුරුවන දෙයක් ලෙස හඳුනාගත යුතු නොවන අතර, ඒ වෙනුවට බලය ලබාගැනීමේ අග්‍රස්ථ ආකාර වශයෙන් හඳුනාගැනීම සිදු කෙරේ (Szeman and Kaposy, 2011: 134,155).

## ෆූකෝඩියානු ශාස්ත්‍රීය සාකච්ඡාවන්හි දැනුම-බලය අන්තර්ගත වී ඇති ආකාරය

මිචෙල් ෆූකෝගේ ශාස්ත්‍රීය දායකත්වයන් තුළ සිදු කෙරෙන විග්‍රහයන් තුළ මූලික ව දැනුම-බලය පිළිබඳ ඔහුගේ සාකච්ඡාවෙහි

බලපෑම් සහගත තර්කනයන් අන්තර්ගත වන බව මීට පෙර ද මෙම ලිපියේ ආරම්භයේ දී දක්වා ඇත. ඒ අනුව, ඔහුගේ තෝරාගත් ශාස්ත්‍රීය කාර්යයන් කිහිපයක් දැනුම-බලය පිළිබඳ තර්කනයන් හා බද්ධව ඉදිරිපත් වන ආකාරය මෙම කොටසින් සැකෙවින් ඉදිරිපත් කෙරේ.

**දැනුමේ පුරාවිද්‍යාව (Archeology of Knowledge) සහ දැනුම-බලය**

කතිකාව යන්න නව ආකාරයේ බලයක් සමඟ ඉදිරිපත් කිරීමට “දැනුමේ පුරාවිද්‍යාව” - “Archeology of Knowledge” (1969) කෘතිය හරහා ෆූකෝට හැකියාව ලැබී ඇත. මූලික ව ම දැනුම සහ පුද්ගලයා අතර ඇති සම්බන්ධතාවය සෙවීමට මෙම කෘතිය හරහා ෆූකෝ උත්සාහ ගනී. ඒ අනුව ෆූකෝගේ මෙම කෘතිය සමාජීය විද්‍යාවන්ගේ ක්‍රමවේදය පිළිබඳ ව අවධානය යොමු කරන්නක් බව කිව හැකි ය. ලෝකය පුරා දියුණු වූ සංකල්ප හා අදහස් පවතී. ඒ අනුව දැනුමේ පුරාවිද්‍යාව හරහා ෆූකෝ උත්සාහ කරන්නේ වචන ගවේෂණය කරමින් ආපසස්සට ගමන් කිරීමට යි. ඒ හරහා ලෝකය දෙස වෙනත් ආකාරයකට බැලීමට හැකියාව ලැබේ. ඒ අනුව පුරාවිද්‍යාවෙන් පස හාරා ඇතුළට ගොස් බලන්නාක් මෙන්, ෆූකෝ පවසන්නේ මානව ශිෂ්ටාචාරය විවිධ කතිකා හරහා ආපසස්සට ගොස් බැලිය හැකි බව යි (Foucault, 1969 q.f. Foucault, 2002).

උදාහරණ වශයෙන්, ඔහු ‘උමතුව හා ශිෂ්ටාචාරය’ කෘතියේදී දැනුමෙහි මූලාශ්‍රය සෙවීම අරමුණු කරගත්තද, ඔහු ඒ සඳහා පාදක කරගන්නා වූ සංසිද්ධිය වන උමතුභාවය, දැනුම - බලය - කතිකාව තුළින්, දැනුමේ පුරාවිද්‍යාව ඇසුරින් සාකච්ඡා කළ හැකි ය. ඒ අනුව, උමතුභාවය සම්බන්ධයෙන් වර්තමාන සමාජයේ පවතින මතවාදය වන්නේ එය මානසික වශයෙන් ඇතිවන රෝගී තත්ත්වයක් වන බවත්, ආයතනගත කිරීම හෝ ඖෂධ හරහා නැතිනම් මනෝ චිකිත්සක ක්‍රම

හරහා එයට යම් පිළියමක් ලබාදිය හැකි බවත් ය. උමතුභාවය සම්බන්ධයෙන් වන වත්මන් කතිකාව ඉවත් කර සියවස් කිහිපයක් ආපස්සට ගොස් බැලූ විට, 18 වන විට සියවසෙහි උමතුව සම්බන්ධයෙන් වන කතිකාව නූතන කතිකාවට වඩා වෙනස් බව, එනම්, උමතුභාවය සහිත පුද්ගලයන් සමාජයට නපුරක් ලෙස සළකා ඔවුන්ව තිරිසන් සතුන් මෙන් යදම් වලින් බැඳ මහජනයාට ප්‍රදර්ශනය කිරීමක් පැවතී තිබේ. එම කතිකාව ද ඉවත් කර තවත් ආපස්සට, එනම් පුනරුද යුගය වෙත ගියහොත් එම යුගයේ උමතුව සම්බන්ධ කතිකාව තුළ උමතු පුද්ගලයන් සිරකරුවන් සහ දිළින්දන් මෙන් වෙනම කොටසක් ලෙස සළකා උමතු නිවාස වෙත යවා තිබේ. ෆූකෝගේ උමතුව සම්බන්ධ විශ්ලේෂණය ආරම්භ වන්නේ මෙම යුගයේ සිටය. කෙසේ නමුත් දැනුමේ පුරාවිද්‍යාව ගවේෂණය කිරීමෙහි ලා තවත් යුගයක් ආපස්සට ගොස් බැලූ විට, මධ්‍යතන යුගයේ දී උමතු පුද්ගලයින් ලාදුරු රෝගීන් සමඟ සිරගත කළ බව කියැවේ (දි සිල්වා සහ අත්තනායක, 2016).

උමතුව හා ශිෂ්ටාචාරය කෘතිය පිළිබඳව ෆූකෝ දක්වන මෙම අදහස මෙහි දී වැදගත් වේ: *"මම (මනෝචිකිත්සක) භාෂාවේ ඉතිහාසය පිළිබඳව ලිවීමට උත්සාහ කළේ නැත. එහෙත් මට අවශ්‍ය වූයේ නිහඬව සිටින පුරා විද්‍යාව පිළිබඳ ලිවීමටය" (ෆූකෝ, උපුටාගත්තේ, දි සිල්වා සහ අත්තනායක, 2016: 325).* මේ අනුව, උමතුව සම්බන්ධ දැනුම සහ කතිකාව ඉතිහාසයේ එක් එක් අවධීන්හි දී වෙනස් වූ ආකාරය දැනුමේ පුරාවිද්‍යාව තුළින් හඳුනාගත හැකි ය. එසේ ම මෙම එක් එක් ඓතිහාසික අවධීන්හි දී මෙම උමතුව සම්බන්ධ දැනුම බලයට නතු වූ ආකාරය ෆූකෝ පෙන්වා දේ. එය ආරෝහණ වශයෙන් ආගමික බලය, රාජ්‍ය බලය, වෛද්‍යමය කතිකාව යන විෂම බල රාමු වෙත කේන්ද්‍ර වීම තුළින් බලය ඇති මිනිසුන් දැනුම හැසිරවීමේ සිට දැනුම ඇති මිනිසුන් බලය හැසිරවීම දක්වා පරිණාමයක් සිදු වී ඇති බව පෙනී යයි.

ඒ අනුව බලය-දැනුම හා සම්බන්ධව අනිවාර්ය අංගයක් වන කතිකාව පිළිබඳ ෆූකෝ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනුයේ මෙම කෘතියේ දී ය. එහි දී එක් එක් යුගයන්හි අදහස්වල පැවතීම හා ඒවා වෙනස්වීම් වලට ලක් වන ආකාරය ද ෆූකෝගේ අවධානයට නතු විය (Poster, 1989). ඒ අනුව දැනුම - බලය පිළිබඳ සාකච්ඡාවේ දී දැනුමේ පුරාවිද්‍යාව යන්න වැදගත් වන ආකාරය, එනම් එහි ප්‍රධාන අදහස් පහත පරිදි හඳුනාගත හැකි ය.

- ෆූකෝගේ මූලික අරමුණ වූයේ, මානව ජීවිතය හැඩගැස්වීමට උපකාරී වන ධනාත්මක දැනුම සොයා ගැනීමට. දැනුමේ ප්‍රධාන අරමුණ වන්නේ මිනිසා වන අතර, සියලු ම දැනුම් ප්‍රභේද පවතිනුයේ මිනිසාගේ සුභසිද්ධිය උදෙසා ය.
- ඒ අනුව සාර්ව මට්ටමින් පැවති දැනුම පුද්ගල නිශ්‍රිත මට්ටමට ආරම්භ විය. ඉතිහාසය තුළ මිනිසාව යටත් කරගැනීමේ ප්‍රධාන මාධ්‍යයක් වශයෙන් දැනුම පැවති බව ඔහු පෙන්වා දෙන අතර, ඔහු සිය මුල්කාලීන විග්‍රහයන්හි දී මෙම දැනුම මෙවලමක් වශයෙන් අර්ථ ගැන්වීම සිදු කර තිබේ.

  කෙසේ නමුත් මෙම පුද්ගල මට්ටම ආරම්භ වීම තාර්කිකත්වය සහ පුද්ගල සවිඥානිකභාවය වර්ධනය වීමට බලපෑ ලෙස ම, ෆූකෝට සමකාලීන සිග්මන් බෞමාන් ආදීන්ගේ අදහස් (Reflexive Modernity) විමසන විට නූතනත්වය තුළ පුද්ගලයා හුදෙකලා වීම යන්නට සාර්ව දැක්ම බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැකි අතර, පුද්ගල මට්ටමින් මෙලෙස චින්තනමය ශක්‍යතාවයක් ලැබීම තුළින් දැනුම - බලය හරහා එකී තත්ත්ව වෙනස් කිරීමට අවකාශ ලැබෙන්නට ඇති බවක් කිව හැකි ය.
- "වෛද්‍ය විද්‍යාව, මනෝ විද්‍යාව, දේශපාලන අර්ථ ශාස්ත්‍රය යනාදී විෂයන් යුරෝපීය චින්තන ඉතිහාසයේදී වෙනස්වන සංකල්ප රාමු,

බලය සහ ආධිපත්‍ය පිළිබඳ දෘෂ්ටිවාදී මාදිලි වශයෙන් බිහි වූ ආකාරය" පෙන්වීමට ද දැනුමේ පුරාවිද්‍යාව තුළින් ෆූකෝ උත්සාහ කරයි (උයන්ගොඩ, 1995: 63).


## දණ්ඩනයේ ඉතිහාසය සහ දැනුම-බලය (Prison Talk)

දඬුවම් කිරීම පිළිබඳ ඉතිහාසය තුළ ප්‍රධාන වශයෙන් ම එය ආරම්භ වන්නේ ශාරීරික වශයෙන් ලබාදෙන්නා වූ හිංසාකාරී ආකාරයක් වශයෙන් වන අතර, එම ක්‍රමය තුළ ඉතා සාහසික ආකාරයේ ප්‍රසිද්ධ තලයේ දඬුවම් ලබාදීමේ ක්‍රම ක්‍රියාත්මක විය. නමුත් කල්යත් ම, මනුෂ්‍යත්වයේ නාමයෙන් සමාජය තුළ දඬුවම් ලබාදීමේ ක්‍රම තුළ යම් වෙනස් වීමක් සිදු විය යුතු ය යන්න හඳුනා ගනිමින්, මර්දනකාරී දඬුවම් ක්‍රම වෙනුවට, ශික්ෂණීය දඬුවම් ක්‍රම ආගමනය විය. ෆූකෝ සිය "Discipline and Punish" (1975) කෘතිය තුළ සාකච්ඡා කරනුයේ මෙම ශික්ෂණීය දඬුවම පිළිබඳව වන අතර, ස්වයං පාලනය සමාජය තුළ ස්ථාපිත කිරීම තුළින් මර්දනකාරී ක්‍රමයෙන් සමාජය පුනරුත්ථාපනය කිරීමට වඩා ස්වයං පාලනය තුළින් බලය වඩාත් යොදවා එම පුනරුත්ථාපන කාර්යය කරවාගැනීම සිදු වන බවයි. එනම්, "ධනවාදී සමාජයේ ආගමනයත් සමඟ ම, නව ආකෘතියක සමාජ පාලනයක් සහ දඬුවම් ක්‍රමයක් පැන නැගුණු බව යි" (දි සිල්වා සහ අත්තනායක, 2016: 351).

මෙම කෘතියේ වැදගත්කම ලෙස වෙන්-එක් ලින්ග්‍රන් වැනි ෆූකෝට සමකාලීන චින්තනයින් දක්වනුයේ, දැනුම සහ බලය අතර සම්බන්ධතාව ෆූකෝ පළමු වරට ඉතා සවිස්තරාත්මකව මෙහි සාකච්ඡා කිරීමත්, එමඟින් නව පන්නයේ සමාජ පාලන සහ අධීක්ෂණ ක්‍රමය, ධනවාදයේ නැගීම හා සම්බන්ධ කිරීමක් ඔහු විසින් සිදු කිරීමත් ය. මේ සඳහා ෆූකෝ මූලික ව ම උපයුක්ත කරගනුයේ 1971 දී ජෙරමි බෙන්තම්

විසින් ඉදිරිපත් කළ *"බන්ධනාගාර ආකෘතිය"* - *"Panopticon"* පිළිබඳ අදහසයි.

**රූප සටහන් අංක 1: *Panopticon***



**මූලාශ්‍ර: (Ernst, 2016).**

ඒ අනුව බන්ධනාගාරයක අධීක්ෂණ කුළුණක් වටා රවුම් ආකාරයට ස්ථාපිත කර තිබෙන සිර මැදිරි ගණනාවක් තිබේ. එක් සිර මැදිරියක සිටින්නෙකුට අනෙක් සිර මැදිරියක සිටින්නෙකු දැකිය නොහැකි නමුත් අධීක්ෂණ කුළුණේ සිටින නිළධාරියාට මෙම සියලු සිර මැදිරි පෙනේ. නමුත් නිළධාරියා කවරෙකු, කුමන දිශාවක් නිරීක්ෂණය කරන්නේ ද යන්න සිරකරුවන් නොදන්නා අතර, තමා ව නිරීක්ෂණයට ලක් කෙරෙන බව පමණක් ඔවුන් දැන සිටිති. ඒ හේතුව මත ඔවුහු නිරන්තරයෙන් තමාව නිරීක්ෂණය කෙරෙන බව උපකල්පනය කරමින් තමා විසින් ම තමාගේ චර්යාව පාලනය කරගනිමින් විනයානුකූලව හැසිරෙති. ඒ ඔස්සේ නිරීක්ෂණය කළ ද, නොකළ ද නිරීෂණය වනු ඇති බව සිතමින් මෙසේ ස්වයං පාලනයක් ඇති කරගැනීම ඔස්සේ බලය භෞතික ව බලහත්කාරී ව යෙදීමකින් තොර ව පුද්ගලයා ශික්ෂණය වේ.

ඉහතදී සඳහන් කළ පාලනත්වය තුළ දී ද සිදුවන්නේ මෙවන් ම බලහත්කාරී නොවන නමුත් වක්‍රාකාර ශික්ෂිත බවකට පත් කිරීමකි. ජෙරමි බෙන්තම්ගේ මෙම අදහස ඔහු නිර්මාණය කළේ බන්ධනාගාර, උන්මන්තකාගාර, ආරෝග්‍යශාලා, වැඩ නිවාස, කර්මාන්තශාලා ආදියට උචිත වන ආකාරයට ය. මේ තුළින් විශාල පිරිසක් වෙත භෞතික ව බලය යෙදීමකින් තොරව, එක් ආකෘතිගත ආකාරයේ උපායමාර්ගයක් හරහා නිරීක්ෂණය ක්‍රියාත්මක කිරීම පිළිබඳ විද්‍යමාන වේ. එනම් දඬුවම් ක්‍රම හෝ මෙසේ සිරගත කිරීම ඇතිවන්නේ පුද්ගලයා පාලනය කිරීම යන අදහස නිර්මාණය වීම සමඟ ය. ඒ සඳහා දැනුම විවිධ ආකාර වලින්, අවස්ථානුකූල ව යොදාගැනේ. මේ හේතුවෙන් අප ජීවත් වන්නේ *" සිරගත කරන ලද සමාජයක" ("Carceral Society")* වන බව ඔහු පෙන්වා දේ.

> *"දඬුවම් කිරීම යනු, සිදු වූ හානියට වන්දි ගෙවීමක් නොව, කිසියම් අධීක්ෂණයක් මත හිඳිමින් අදාළ පුද්ගලයා විසින් ගෙවන ස්වයං වන්දියකි. එමඟින් එම පුද්ගලයා සමාජයේ අනෙකුත් අය සමඟ පවත්වන සම්බන්ධතා සහ සිය චරිතය අහිමි කරගනී" (Foucault, Quoted from, Gallagher, 2008: 401).*

බන්ධනාගාර යනු, ධනවාදීන්ගේ අවශ්‍යතාවට බිහි වූ ආයතන ලෙස ෆූකෝ දකින අතර, ධනවාදියා තමාගේ ආරක්ෂණ උපක්‍රමයක් වශයෙන් එය උපයුක්ත කරගනී. ඒ අනුව ෆූකෝ දක්වනුයේ, ධනවාදී සමාජය සංවර්ධනය වීමට මෙම සිරගත කරන ලද සමාජය උපකාරී වන බව යි. එනම්, පාසලේ, රෝහල්වල, බන්ධනාගාරවල, කර්මාන්තශාලාවල පුද්ගලයා හුදෙකලා අයෙකු පමණක් නොව, විනයානුකූල පාත්‍රයෙකු බවට පත් කර තිබේ. විනයානුකූල බලයෙහි ලක්ෂණ වන්නේ,

ධුරාවලිගත අධීක්ෂණය, බාධාකාරී තත්ත්ව සාමාන්‍යකරණය කිරීම සහ සියුම් ලෙස පරීක්ෂා කිරීම යන ඒවා ය.

මෙම විනයානුකූල බලය, දැනුම සමඟ තදින් ම බැඳී පවතී. උදාහරණ වශයෙන්, පාසල යන ආයතනය තුළ නිසි නිළ ඇඳුමක්, හැසිරිය යුතු ආකාරය සම්බන්ධ ප්‍රමිතීන් පවතින අතර, අධ්‍යාපනය හා සම්බන්ධ කාරණාවලදී මෙන් ම විෂය බාහිර කාරණාවලදීත් බලය ප්‍රශ්න නොකිරීමට, හැසිරීම සම්බන්ධ ව පවත්වාගත යුතු ප්‍රමිතීන් සාමාන්‍යකරණය කර ගැනීමට හුරු පුරුදු කරන අතර, පාසල තුළ ගුරුවරුන්, විදුහල්පති ආදීන් හරහා ළමුන් නිරීක්ෂණය කෙරේ. එම තලයේ දී නිරීක්ෂණය වූවත්, නොවූවත් විනයානුකූලව හැසිරීමට ළමුන් තුළ ස්වයං පාලනයක් ඇති කරවයි. එම විශේෂිත වූ දැනුම හරහා ධනවාදී සමාජ ක්‍රමය ප්‍රශ්න නොකරන, එය පිළිගන්නා ළමුන් බිහි කිරීමක් සිදු කෙරෙන බව ෆූකෝගේ තර්කනයට අනුව කිව හැකිය. ඒ අනුව දෘඪ බලයක් යෙදීමකින් තොර ව මෘදු බලයක් හරහා මේ ඔස්සේ සමාජ පාලනයක් සිදු කෙරේ.

එනම්, ස්වයං පාලනයට ලක් කරන ලද ළමුන්, රෝගීන්, කම්කරුවන් කිසිදු අවස්ථාවක බලය ප්‍රශ්න කිරීමට උත්සුක නොවන අතර, එය *"හික්මවන ලද සිරුරු" ("Docile Bodies")* නිර්මාණය කිරීමක් සිදු කරන බව ෆූකෝ පෙන්වා දේ. ඒ අනුව සිරගත කරන ලද සමාජය දැනුමෙහි සහ බලයෙහි ප්‍රායෝගික භාවිතයක් බව හඳුනාගත හැකි ය. ඉදිරියේ දී සාකච්ඡා කෙරෙන ජෛව දේශපාලනය ද මේ හා සම්බන්ධ වන අතර, රෝහලක වෛද්‍යවරයාගේ රෝග විනිශ්චය හෝ ප්‍රතිකාර සම්බන්ධයෙන් විරෝධතා එල්ල නොවීම මේ හා සම්බන්ධ වේ. වෛද්‍යමය කතිකාව මඟින් වෛද්‍යවරයා සතු විශේෂ ප්‍රාගුණ්‍යය නැතිනම් අනෙකෙකුට නොමැති විද්‍යාත්මක දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම්, රෝහල තුළ රෝගීන්ව හික්මවන ලද සිරුරු බවට පත් කරයි.

වෛද්‍ය කතිකාව තුළ ගොඩනැගෙන්නාවූ දැනුමත්, ඊට අදාළ බලයත් නිරන්තරයෙන් ම සමාජය තුළ බලවත් වේ.

දැනුම නිර්මාණයේ දී වෛද්‍යවරයාට පමණක් නොව, එක් එක් ක්ෂේත්‍රයන්හි විශේෂඥතාව දරන පාර්ශ්වයන් එක්තරා ආකාරයක රෙජිමේන්තු බවට පත්වන අතර, ගුරුවරයා, මාධ්‍යවේදියා, පර්යේෂකයා ආදී වූ විවිධ වෘත්තීන්හි නියැලෙන පාර්ශවයන් දැනුම සමාජගත කිරීමේ ආධිපත්‍යධාරී පාර්ශ්වය වන විට එම දැනුම ප්‍රශ්න නොකරන, දෙන ලද දෙයක් ලෙස පිළිගැනීමට පෙළඹෙන පාර්ශ්වයන් නිර්මාණය වීමේ ඉඩකඩ ඉහළ වේ. නමුත් සමාජය තුළ මෙම එක් එක් රෙජිමේන්තු හරහා විනය නිර්මාණය කිරීමට පසුබිම් සකස් කිරීම ධනාත්මක මෙන්ම ඍණාත්මක ලෙස ද බලපානු ලැබේ. පාසල් යන දරුවා අධි-ශික්ෂණයට (indoctrinate) ලක් කිරීමට ගුරුවරයාට හැකියාවක් ලැබෙන්නේ ද, යථාර්ථවාදී නොවන කතිකාවන් 'නිර්මාණය කරන ලද යථාර්ථයන්' ලෙස සමාජගත කිරීමට මාධ්‍යවේදීන් සමර්ථ වන්නේ ද මෙකී දැනුම සම්බන්ධ ව පවතින බල සහිතභාවය හේතුවෙනි.

ඒ අනුව, විනය යනු බලය හැසිරවීමේ ආකාරයක් වන අතර, බලය ක්‍රියාත්මක කිරීමේ උපක්‍රමයන්ට බලය ලබාදෙනුයේ දැනුම හරහා බව පැහැදිලි වේ. එසේ ම, විනය හා බලයත්, ඊට පදනම සකසන දැනුමත් සමාජයට ධනාත්මක සහ ඍණාත්මක යන දෙආකාරයෙන් ම බලපානු ලැබේ.

**ලිංගිකත්වය - දැනුම - බලය**

සමාජයේ අප්‍රකාශිත තලයේ පැවති අංශයක් ඇසුරින් බලය පිළිබඳ විග්‍රහ කිරීමටත්, ඊට දැනුම සම්බන්ධ වන ආකාරයත්, දැනුම තුළින් බලය උපදින ආකාරය විග්‍රහයටත් ෆූකෝ රචනා කළ " ලිංගිකත්වයේ ඉතිහාසය" පිළිබඳ වෙළුම් ත්‍රිත්වය වැදගත් වේ.

ලිංගිකත්වය තුළ බලයේ පැවැත්ම, දශක ද්විත්වයක ඉතිහාසයේ එය පැවති ආකාරය සහ ග්‍රීක සහ රෝම ඉතිහාසය තුළ එහි ස්වභාවය විග්‍රහය ඔහු සිදු කළ අතර, එකිනෙකට වෙනස් අංශ ත්‍රිත්වයක් ගවේෂණය කරන්නාක් මෙන් පෙනී යයි. එහෙත්, ෆූකෝ එම ත්‍රිත්වය තුළ ම සිදු කළේ මානව ශිෂ්ටාචාරයේ පෞද්ගලික තලයට කොටු වූ, බලය දැඩි ලෙස ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයක් වූ ලිංගිකත්වය දැනුම සහ බලය ඔස්සේ විමසීම වන බව කිව හැකි ය.

එහි දී ලිංගිකත්වය හා සම්බන්ධ දැනුමේ විවිධ ස්වරූප විශ්ලේෂණය කිරීම අරමුණු වූ අතර, ඒ තුළ පීඩනය හෝ නීතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමක් අවශ්‍ය නොවූවා සේ ම, බලය පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම ෆූකෝගේ අරමුණු වී තිබේ. එහි දී මීට පෙර සඳහන් කළ ආකාරයට ම ෆූකෝ බලය දකින්නේ දෙන ලද රාජ්‍යයක පුරවැසියන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට තිබෙන යාන්ත්‍රණය වශයෙන් නොවේ. ඒ අනුව පෙර දීර්ඝ වශයෙන් විස්තර කළ ආකාරයේ බහුවිධ සුවිශේෂතා ඇති බලයට, ලිංගිකත්වය පිළිබඳ දැනුම ස්ථාපිත කළ හැක්කේ කෙසේ ද යන්නත්, එසේ ස්ථාපිත කිරීම අවශ්‍ය වන්නේ ඇයි ද යන්නත් ඔහු විග්‍රහ කරයි (Szeman and Kaposy, 134-136).

ඒ අනුව, ෆූකෝ (1980: 183) විසින් මෙම ග්‍රන්ථය තුළ අවධානය යොමු කරන ප්‍රශ්න කිහිපයකි:

- 18 වන සියවසේ සිට සොයාගත්, සැළකිල්ලට ගත්, ලිංගිකත්වය පිළිබඳ නියම කතිකාව පිළිබඳ සියලු ආධිපත්‍ය පැතිරවීම් මොනවා ද ?
- ලිංගික චර්යාව පිළිබඳ සහතික වශයෙන් පවතින නීති - රෙගුලාසි හා ඒ පිළිබඳ ව පැවසෙන දේවල් මොනවාද ?
- ලිංගිකත්වය පිළිබඳ විශේෂ ආකාරයේ කතිකාවන් මොනවා ද ?

- ඓතිහාසික වශයෙන් විශේෂ ස්ථානයන්හි, මතුවන ලිංගිකත්වය හා සම්බන්ධ කතිකාවන් මොනවා ද ? (දරුවන්ගේ ශරීරය, කාන්තාවන්ගේ ලිංගිකත්වය, උපත් පාලනය ආදිය සම්බන්ධව)
- වඩාත් මෑත කාලීන ව, වඩාත් ප්‍රදේශීය ව ක්‍රියාත්මක වන බල සම්බන්ධතා මොනවා ද ?

විශේෂයෙන් ම ෆූකෝගේ මෙම ලිංගිකත්වය හා සම්බන්ධ රචනාවන්ට ආරම්භයේදී ම සඳහන් කළ ඔහුගේ පෞද්ගලික වාතාවරණයන් සහ සමලිංගිකයෙකු වශයෙන් ඔහුගේ ලිංගික දිශානතියත්, ඔහුගේ මානසික වාතාවරණයත් බලපාන්නට ඇති බව විචාරක මතවාද අතර වේ. කෙසේ නමුත්, ඔහු ලිංගිකත්වය සමාජය තුළ පාලනය කිරීමට බලය යෙදුණු ආකාරය පිළිබඳ ව දැනුමේ පුරාවිද්‍යාව මඟින් කතිකාමය ගවේෂණයක් සිදු කරන අතර, එහි ඓතිහාසික ස්වභාවය ඇසුරින් අදාළ සමාජ වාතාවරණයන් කියැවීමත්, දැනුම හා බලය තුළින් එය වෙනස්වන හෝ බලගැන්වෙන ආකාරයත් ඔහු පෙන්වා දේ.

ෆූකෝ (1980: 69) උපුටා දක්වමින් උයන්ගොඩ (1995) ඉදිරිපත් කරන්නාවූ පහත ප්‍රකාශයෙන් ඒ බව තවදුරටත් සනාථ වේ.

> *"දහනව වන සියවසේ බිහිවූ ධනේෂ්වර සමාජය ලෛංගිකත්වය සමඟ පොර බැදුවේ එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමෙන් නොවේ. ඇත්තෙන්ම එය කළේ, ලෛංගිකත්වය සඳහා වූ සංවාද භූමියක් සඳහා වූ සමස්ත යාන්ත්‍රණයක් බිහි කිරීමයි. එය ලිංගික දේ ගැන කතා කළා පමණක් නොව, එසේ කරන්න යැයි සෑම දෙනාටම බල කළේය. ඒ සමඟම ලෛංගිකත්වය පිළිබඳ ඒකාකාර සත්‍යයක්ද නිර්මාණය කළේය. එසේ කළේ, ලිංගිකත්වය විසින් කිසියම්*

*මූලධාර්මික සත්‍යයක් වසන් කරගෙන තිබෙනු ලැබුවාක් මෙනි; එනම්, සුවිශේෂ සත්‍යයක් නිෂ්පාදනය කිරීමට එය අවශ්‍ය වූවාක් මෙනි"*

ඒ අනුව, ෆූකෝ ඉදිරිපත් කරන ලිංගිකත්වය හා ලිංගික තාක්ෂණය පිළිබඳ දැනුමෙහි 'දැනුම හා බලය' ආශ්‍රය කරගත් උපාය මාර්ග හතරක් ඇති බව, ද සිල්වා සහ අත්තනායක (2016) දක්වා ඇත. ඒවා නමින්, 'කාන්තා ශරීරය හිස්ටීරියාවක් (Hysteria) බවට පත්කිරීම, ළමුන්ගේ ලිංගිකත්වය පිළිබඳ දැනුවත්භාවය, ප්‍රජනන චර්යාව සමාජානුයෝජනය කිරීම, සහ දූරාචාර ලෙස ලිංගික වින්දනය සෙවීම මනෝ චිකිත්සාව මඟින් හැසිරවිය යුතුය' යන ඒවා වේ. ඒ අනුව ඔහු මෙසේ ලිංගිකත්වය සම්බන්ධයෙන් බලය භාවිත කිරීම, "කායික බලය" (Bio-power) යොදාගැනීම ලෙස නම් කරනු ලැබේ (ද සිල්වා සහ අත්තනායක, 2016ඃ 357-358). තවදුරටත් ලිංගික චර්යාව සම්බන්ධයෙන් එම බලය යොදාගැනීමේ වැදගත්කම ෆූකෝ දක්වන්නේ පහත ආකාරයෙනි.

*"කායික බලය භාවිත කිරීම මඟින් ජීවිතය හා එහි යාන්ත්‍රණය නිශ්චිතව ගණනය කිරීම් චක්‍රයක් බවට පත්වේ. දැනුම හා බලය පිළිබඳ මෙම සුසංයෝගයට අනුව, මානව විපරිවර්තනය කිරීමේ ශක්තියක් ඇතිවේ. ලිංගිකත්වය පිළිබඳ ප්‍රතිමාන සහ භාවිත අභ්‍යන්තරීකරණය වන විට පුද්ගලයා අභ්‍යන්තරයෙන් පාලනය වේ" (Foucault, 1992).*

බලය - දැනුම, ලිංගිකත්වය තුළ විග්‍රහ වන ආකාරය මේ අයුරින් සැකෙවින් පැහැදිලි කළ හැකි ය.

## ජෛව දේශපාලනය - දැනුම - බලය

ජෛව දේශපාලනය, ජෛව බලය යන ද්විත්වය ම බලය-දැනුම සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට ඉස්මතු වන එකිනෙක

ආසන්නයෙන් ගමන් කරන සාකච්ඡාවන් වේ. එසේ ම මෙම ලිපිය තුළ පෙර දී සාකච්ඡා කරන ලද සිරගත කරන ලද සමාජය, ඉතිහාසය තුළ බලය පැවති ආකාරය සහ ලිංගිකත්වය යන අංශයන්හි දී ද මේ පිළිබඳ සාකච්ඡා කෙරිණි. එනම්, මානව ශරීර ශිෂ්ටාචාරය මඟින් විවිධ ගොඩනැඟීම් මඟින් පාලනය කෙරුණු ආකාරය, එම පාලනය සමඟ දැනුම ඍජු ව ම සම්බන්ධ වී පවතින ආකාරය ෆූකෝ ජෛව දේශපාලන සාකච්ඡාව තුළින් සාකච්ඡා කරයි. එබැවින් බලය-දැනුම සාකච්ඡාව යම්තාක් දුරකට ජෛව දේශපාලනය සංකල්පයෙන් කියැවීමට උත්සාහ ගැනීමක් මෙම කොටසේ දී සිදු වේ.

ෆූකෝ ප්‍රකාශ කරන ආකාරයට, බලය පුද්ගලයා තුළ පවතී. ඒ තුළින් අප අපව ම පාලනය කරගනු ලැබේ. එසේ ම ඔහු තවදුරටත් ප්‍රකාශ කරනුයේ එය සිදුවන්නේ සැඟවුණු අණ කිරීම් මඟින් වන බව යි. එනම් දැනුම/බුද්ධිය ලෙස නිර්මාණය කර ඇති කතිකාව හරහා අකර්මකාරක කර්තෘ කෙනෙක් මඟින් අපව පාලනය කරනු ලැබේ. මේ බව තවදුරටත් ෆූකෝ, *"Knowledge control basic biological desires and emotions"* ලෙස දක්වයි. ඒ අනුව අප ජීවිතයේ ආශාවන් දැනුම මඟින් පාලනය කරනු ලබන අතර, එම බලය දැනුම සතු ව පවතී.

මේ මත සෞඛ්‍යය මඟින් අපගේ ශරීර පාලනයට ලක් වීම ඉතා හොඳින් විශද වේ. ෆූකෝගේ ශාස්ත්‍රීය කාර්යයන් අතර වන, "Birth of the Clinic" (1973) ග්‍රන්ථය හරහා දැක්වෙන ආකාරයට, වෛද්‍යවරුන්, හෙදියන්, රෝහල් සහායකවරු ආදි වෛද්‍ය කතිකාව තුළ හඳුනාගත හැකි පාත්‍රයින් හරහා ආරෝග්‍යශාලා තුළ නේවාසික රෝගීන් සහ සායනවලට සහභාගී වන රෝගීන් නිරීක්ෂණයට ලක් කෙරේ. මෙය ෆූකෝ වෛද්‍යමය බැල්ම (Medical Gaze) ලෙස හඳුන්වන අතර, රෝගියාගේ සමස්ත ශරීරය පාලනය කිරීම සම්බන්ධ බලය මේ තුළින් වෛද්‍යවරයාට ලැබේ (Foucault, 1973 q.f. Foucault, 1980: 167).

රෝගියාට, රෝගය සම්බන්ධයෙන් මෙන්ම, වෛද්‍ය කතිකාව සම්බන්ධ පුළුල් අවබෝධයක් නොමැති වන හෙයින් රෝගියා වෛද්‍ය කතිකාවට ද බියක් දක්වන අතර, රෝග විනිශ්චය හෝ ප්‍රතිකාර සම්බන්ධ ව ප්‍රශ්න කිරීමක් සිදු නොකරයි. එහි දී වෛද්‍යවරයා බල කිරීමක් නොකරන නමුත්, වෛද්‍ය කතිකාව තුළ ඇති බලයට රෝගියා නතු වේ. අනෙක් අතට, වෛද්‍ය කතිකාව තුළ පවතින දැනුම මීට හේතු වී තිබෙන බව කිව හැකි ය. එනම්, වෛද්‍යවරයාගේ දැනුම සහ අත්දැකීම් පහසුවෙන් ආදේශ කළ නොහැකි ඒවා ය. මේ මත දැනුම තුළින් ලැබෙන බලය හරහා මානව ශරීරය පාලනය කිරීමට වෛද්‍යමය බැල්මට හැකියාව ලැබෙන අතර, ඒ තුළින් මානව ශරීරය පාලනය කිරීමේ දේශපාලනික බලය වෛද්‍ය කතිකාවට ලැබෙන බව කිව හැකි ය.

ඒ අනුව ෆූකෝ මෙහි දී සංවිධානාත්මක බුද්ධියට මිනිස් ශරීරය සම්බන්ධ කරනු ලැබේ. ඒ ඔස්සේ පුද්ගලයා සහ සමාජ ව්‍යූහය අතර යම් පාලනයක් ඇතිවේ. ඒ අනුව සංවිධානාත්මක දැනුම මඟින් පුද්ගලයාව පාලනය කරනු ලැබේ. ඉහත දැක්වූ, පවුල් සැලසුම්, ලිංගිකත්වය, උපත් පාලනය ආදී සියලුම ජීව විද්‍යාත්මක අංශ හා සම්බන්ධ වූ සංවිධානාත්මක දැනුම මඟින් අපව පාලනය කිරීම සිදු කෙරේ. අනෙක් අතට, ආයතනගත වූ සංවිධානාත්මක දැනුම මඟින් සිදු කරනුයේ ද ජෛව දේශපාලනය සඳහා අවනත වන්නාවූ කීකරු සිරුරු (Docile Bodies) නිර්මාණය කිරීම යි. ඒ අනුව පුද්ගල අනන්‍යතාවය පරිපූර්ණ වශයෙන් ම බලය යටතට පත් වන අතර, පුද්ගලයා විසින් තමාව ම පාලනය කරගැනීම මූලික ව ම සිදු වේ. එහි දී පුද්ගල කැමැත්තට වඩා මෙම බල ව්‍යූහ මඟින් ගොඩනගන ලද දැනුම මඟින් නිර්මාණය කරන අදිසි බලයට පුද්ගලයා ස්වකීය ස්වයං පාලනයෙන් ම නතුවේ.

ජෛව දේශපාලනය යන සාකච්ඡාව බලය-දැනුම හා සම්බන්ධ වන ආකාරය මෙසේ හඳුනාගත හැකි අතර, මානව ශරීරය දේශපාලනික ප්‍රපංචයක් බවට පත් වීමෙහි ලා පුද්ගලයා ස්වකීය ස්වයං වාරණ හා ස්වයං පාලන නියමයන් උපයුක්ත කරගන්නා බව මේ හරහා මනාව පෙන්වාලයි. අනෙක් අතට, සමාජය විසින් නිර්මාණය කරනු ලබන සංවිධානාත්මක දැනුමේ බල අධිකාරය මඟින් සමාජ ව්‍යුහය තුළ තනි පුද්ගලයාගේ ශරීරය මත බලය යොදනු ලැබේ. ඒ අනුව ජෛව දේශපාලනය ද බලය-දැනුම සංකල්පයෙන් විතැන් කොට සාකච්ඡා කළ නොහැකි බව පැහැදිලි වන අතර, ෆූකෝගේ ශාස්ත්‍රීය විග්‍රහයන් තුළ එකිනෙකට බැඳී පවතින බහුතර අදහස් සමඟ ජෛව දේශපාලනය ද නිතරගයෙන් ම සම්බන්ධ වී තිබෙන බව කිව හැකි ය.

## ෆූකෝගේ බලය-දැනුම සාකච්ඡාව සම්බන්ධයෙන් මතුවූ විවේචන සහ ප්‍රති-තර්ක

මිචෙල් ෆූකෝගේ දැනුම-බලය සාකච්ඡාවටත්, එය පදනම් කරගෙන ෆූකෝ විසින් සිදු කරනු ලබන සාකච්ඡාවන්ටත් එල්ලවන විවේචන සහ ඒවා සම්බන්ධ ප්‍රති-තර්ක කිහිපයක් මෙම කොටසේ දී ඉදිරිපත් කෙරේ.

ඒ අනුව මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට කැපී පෙනෙන විවාදයක් වශයෙන් ජර්ගන් හබමාස් යන ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ දෙවන පරපුරෙහි න්‍යායධාරියා විසින් සිදු කරන විවේචන සහ පැහැදිලි කිරීම් කැපී පෙනේ. හබමාස් සිය "The Philosophical Discourse of Modernity" (1987) කෘතිය හරහා ෆූකෝගේ ශාස්ත්‍රීය කාර්යයන් සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කරයි.

> *"What is then we are the grounds that determine Foucault to shift the meaning of this specific knowledge and the truth that is constitutive for the modern form of knowledge in general, and for the human sciences in particular, by generalizing this will to knowing self-mastery into a will to power per se and the postulate that all discourses can be shown to have the character of hidden power and derive from the practices of power?" (Habermas, 1987).*

තම ප්‍රශ්නයට හබමාස් විසින්ම මෙහි දී පිළිතුරක් දක්වමින් ප්‍රකාශ කරනුයේ, යමෙකු ඥාන විභාගය (episteme) සම්බන්ධ ප්‍රශ්නයක් ගතහොත් ඔහුට එය මෙහෙයවීමට නොහැකි වන බව යි. ඒ අනුව ෆූකෝ බලය-දැනුම පිළිබඳ සැම විට ම විග්‍රහ කළ ද, ඒ හා සම්බන්ධ වන ඓතිහාසික ඥාන විභාගය ඔහු විසින් අවබෝධ කරගෙන නොමැති බවට හබමාස් විවේචනය කරයි. දැනුමේ ඒකාධිකාරයේ ආකාරයන් ෆූකෝ මගහරිමින් අනෙක් අතට, බලයේ භාවිතයන් දැනුම් තුළින් මතුවන ආකාරය විශ්ලේෂණයට උත්සාහ ගන්නා බව දක්වමින් හබමාස් විසින් තවදුරටත් විවේචනය කරයි. කෙසේ නමුත්, බලය හා පෙළපත් විද්‍යාව (Geneology) පිළිබඳව ෆූකෝගේ අදහස් සමඟ හබමාස් එකඟ වේ. තවදුරටත් හබමාස් විසින්, ෆූකෝගේ වාස්තවිකත්වය හා නූතනත්වයේ ආයතන පිළිබඳ තර්කයන්ට එකඟ වන අතර, අනෙක් අතට දේශපාලනය හා ආචාරධර්ම මත පදනම් ව නූතන ආයතන විවේචනය කිරීමට ෆූකෝ අසමත් වී තිබෙන බවට හබමාස් විවේචනය කරයි (Martin, 1982: 2-5).

ෆූකෝ සහ හබමාස් යන දෙදෙනා ම බලය සහ දැනුම යන එකිනෙකට සම්බන්ධ කරන ලද නමුත්, ෆූකෝ එය තර්කනය, බලය හා

ආධිපත්‍ය සමඟ සම්බන්ධ කිරීමට උත්සාහ කරන විට, හබමාස් වෙනස් ආකාරයක තර්කනයක් ඊට ආදේශ කරගනී. එසේ ම, නූතනත්වය සහ ප්‍රබුද්ධත්වය සම්බන්ධ අදහස් ෆූකෝ විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඔහුට හබමාස්ගේ විවේචන එල්ල වේ. එසේ ම, නූතනත්වය හරහා අධිපතිත්වය පමණක් පතුරුවන ලද බව විශ්වාස කළ නොහැකි බවත්, නූතනත්වය මඟින් සෞඛ්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස, නීතිය හෝ සමානාත්මතාවය යන අංශයන්හි ප්‍රගතියක් ඇති කළ බවත්, ඒවා ෆූකෝ විසින් ග්‍රහණය කරගෙන නොමැති බවටත් හබමාස් විවේචනය කරමින් දක්වයි (Simon, 1994: 950).

එමෙන් ම, හබමාස් විසින් ඉදිරිපත් කරන තවත් විවේචන කිහිපයකි. නූතනත්වයේ සැබෑ තත්ත්ව අවබෝධ කරගැනීමට ෆූකෝ අසමත් වූ බවත්, එහි එක් පැත්තක් පමණක් අවබෝධ කරගත් බවටත් හබමාස් මෙන් ම, Taylor (1950) සහ Honneth (1999) යන දෙදෙනා විසින් ද දක්වන අතර, ඔවුන් ද නූතනත්වය පිළිබඳ ඒක පාර්ශ්වීය කරුණු දැක්වීමක් සිදු කර තිබෙන බව පවසමින් ෆූකෝව විවේචනය කරයි (Taylor and Honneth, q.f. Poster, 1989). එසේ ම, බලය හා දැනුම එකිනෙකට සම්බන්ධ කිරීමට ගත් උත්සාහය තුළ බලය නිරායාසයෙන් ම පසුබැස තිබෙන බවත්, බලයට තිබෙන වැදගත්කම ඒ තුළින් අහිමි කර තිබෙන බවටත් විවේචනය වේ (Woermann, 2012).

ෆූකෝ ප්‍රකාශ කරන ආකාරයට, බලය ප්‍රතිරෝධය තුළින් උපදින නමුත්, ඔහු ප්‍රතිරෝධය සහ එහි ස්වරූපය කිසිදු අවස්ථාවක දී විස්තර සහිත ව නිර්වචනය කර නොමැත. වෙනත් ආකාරයකින් කිවහොත්, ප්‍රතිරෝධයේ වංශාවලිය (Geneology of Resistance) ෆූකෝ විසින් නිසියාකාර ව සංවර්ධනය කිරීමට අපොහොසත් වී තිබේ. එසේ ම, බලය පුද්ගලයා තුළ ස්වකීය වශයෙන් ක්‍රියාත්මක වන බලවේගයක් වශයෙන් ෆූකෝ හඳුනාගන්නා නමුත්, ඔහු විසින් ආර්ථික සහ දේශපාලන බලයන්,

පරිපාලන බලයන් සහ බලයේ ආකාරවල වැදගත්කම අමතක කර තිබෙන බවට විවේචන එල්ල වේ (Edmonds, 2011). බල අරගලවල ප්‍රතිරෝධයේ ක්ෂුද්‍ර මට්ටම පිළිබඳ ව ඔහු සාකච්ඡා කරන නමුත්, ප්‍රාදේශීය අරගලවල නූතන ස්වභාවය පිළිබඳ ව ඔහු සාකච්ඡා නොකරයි. ප්‍රාදේශීය අරගලවල වැදගත්කම අනිවාර්ය වශයෙන් ම මඟහැරිය නොහැකි දෙයක් වන අතර, ඛණ්ඩනය වීම් මඟහරවා ගැනීමට නම් ප්‍රාදේශීය අරගලවල බහුවිධතාවයන් නිසි ආකාරයන්ගෙන් සම්බන්ධ කරගැනීම සහ එකතු කිරීම අවශ්‍ය වේ. නමුත් ෆූකෝ විසින් මෙම පැතිකඩ මඟහැර තිබෙන බවට විවේචනය වේ (Simon, 1994: 947).

ස්ත්‍රීවාදී පර්යාලෝකය මඟින් ෆූකෝගේ අදහස් සම්බන්ධ විවේචන මෙන් ම, එම විවේචනයන්ට ප්‍රති විවේචන ද එල්ල වේ. ඇතැම් ස්ත්‍රීවාදීන් ඉතිහාසය තුළ කාන්තාවන්ගේ අත්දැකීම් සම්බන්ධයෙන් ෆූකෝ නොසළකා තිබෙන බව දක්වමින් විවේචන එල්ල කරනු ලැබේ. ෆූකෝ තම ශාස්ත්‍රීය කටයුතුවල දී ඉතිහාසය තුළ මානව විෂයන් දියුණු වූ ආකාරය විශාල වශයෙන් සාකච්ඡා කරන බැවින්, අති විශාල මානව විෂයක් වන ස්ත්‍රීන් සම්බන්ධයෙන් නොතකා සිටීම ඔහුගේ තර්කයේ න්‍යායාත්මක අර්බුද ඉස්මතු කරන බවට විවේචනය වේ. එනම්, කාන්තාව පුරුෂාධිපත්‍යයට යටත් තැනැත්තියක් ලෙස සැලකීම පමණක් ෆූකෝ සිදු කර තිබෙන බවත්, කාන්තාව සතු බලය හා දැනුම යටපත් කොට තිබෙන බවත් ඉන් හැඟවේ. තවත් ස්ත්‍රීවාදීන් පිරිසක් තර්ක කරන්නේ ෆූකෝඩියානු පර්යාලෝකය මඟින් කාන්තා ශරීරය, දැනුමේත් බලයේත් මෙවලම් බවට පත්වීම පිළිබඳව විග්‍රහ වන බව වන අතර, එසේ අවධානයට ලක්වීම හේතුවෙන් ඔවුන් ෆූකෝ සම්බන්ධ පෙර දැක්වෙන විවේචනය ප්‍රතික්ෂේප කරයි. ඒ තුළින් සමාජය ඉදිරියට ගමන් කිරීමටත්, දැනුම සහ බලය ක්‍රියාත්මක කිරීම සඳහාත් පුරුෂාධිපත්‍ය ආකෘතියක්

තුළ කාන්තාව පාලනය කිරීම්වලට ලක්වූ ආකාරය ෆූකෝ විසින් දක්වන හෙයින් ඔහු ඔවුන් හරහා ඇගයීමට ලක්වේ (Martin, 1982: 8-10).

ෆූකෝට එරෙහි ව එල්ල වන තවත් විවේචනයක් වන්නේ, ඔහු සූක්ෂ්ම තලයේ බල සම්බන්ධතා පිළිබඳ ව සාකච්ඡා කළ ද, ඔහුගේ අදහස් තුළ මාක්ස්ගේ අදහස් සහ රාජ්‍ය පිළිබඳ අදහස් පවතින බවයි. එනම් ෆූකෝ තුළින් සාර්ව තලයේ විශ්ලේෂණය තුරන් වී නොමැති බවයි. මේ අනුව මිචෙල් ෆූකෝගේ බලය-දැනුම සාකච්ඡාවට පවතින විවේචන කිහිපයක් පොදුවේ මෙසේ සැකෙවින් සාකච්ඡා කළ හැකි ය. කෙසේ නමුත්, මෙවන් විවේචන අතර වුවත් ෆූකෝ විසින් මෙම පශ්චාත් නූතන සුසමාදර්ශයේ සිටිමින් බලය පිළිබඳ න්‍යාය අවබෝධ කරගැනීමට ගත් උත්සාහය බොහෝ තැන්හි දී අගය කෙරේ.

**සමාලෝචනය**

සමාජ න්‍යාය තුළ බලය යන්න නිර්වචනය වී තිබූ ආකාරයට වෙනස් ආකාර වූ අර්ථ ගැන්වීමක් එක් කළ මිචෙල් ෆූකෝගේ බලය-දැනුම සාකච්ඡාව පිළිබඳ සමස්ත විග්‍රහය හරහා ඉදිරිපත් වේ. බලය-දැනුම එකිනෙකට අනන්‍ය වූ ලක්ෂණවලින් සමන්විත වන අතර, එය රාජ්‍ය බලය හෝ පුද්ගලයෙක් මත යොදන්නාවූ බලහත්කාරී යෙදවීමක් නොවේ. බලය යනු, දැනුම හා බැඳී පවතින, පුද්ගලයා මත ස්වයං පාලනය ඇති කරවන මෘදු බලය යෙදීමක් බව ෆූකෝ පෙන්වා දේ. එය දැනුමේ ඓතිහාසික කතිකාමය ගොඩනැගීම, උන්මන්තකභාවය හා ආයතනගතකරණය, ලිංගිකත්වය මෙන්ම සමාජමය පාලනය යනාදී සෑම පැතිකඩක් තුළ ම නිමග්නව පවතී. එසේම බලය තුළින් දැනුම ඇතිවිය හැකි සේ ම, දැනුම තුළින් ද බලය ඇතිවිය හැකි ය. එහෙයින් බලය පිළිබඳව ප්‍රකට සාකච්ඡා ගෙනයන මැකියාවෙලී, වෙබර් ආදී චින්තකයින්

අතරට, විවේචනාත්මකව බලය පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කිරීමේ ගෞරවය ෆූකෝ හට හිමි වේ.

ෆූකෝඩියානු දර්ශනයේ අන්තර්-විෂයිකභාවය හේතුවෙන් ඔහු ඉදිරිපත් කරන බලය පිළිබඳ විග්‍රහය තුළ බහුවිධතා නිරූපණය වන අතර, ආයතනගත දැනුම මඟින් අපගේ චින්තනයට සියුම් ආකාරයෙන් බලපෑම් කරන බවත්, පුද්ගල අනන්‍යතාවයට එමඟින් බලපෑමක් ඇති කරන බවත් බලය-දැනුම සාකච්ඡාව ඔස්සේ ගැඹුරින් සාකච්ඡා කෙරේ. දැනුම ඔස්සේ ගොඩනැගෙන බලය මඟින් මිනිස් වර්ගයා කීකරු ශරීර බවට පත් කර තිබෙන බවත්, ධනවාදයේ සුමට ක්‍රියාවලියට එමඟින් පහසුකම් සළසන බවත් ෆූකෝගේ විග්‍රහය තුළින් ධ්වනිත වේ.

බලය-දැනුම තුළින් සියලු ම සංසිද්ධි විශ්ලේෂණයට ෆූකෝ ගත් උත්සාහය තුළ ෆූකෝ එක් පාර්ශ්වයකින් පමණක් සමාජය විශ්ලේෂණය කළ බවටත්, බහුවිධ මාන මතුපිටින් ගවේෂණය කළ බවටත් පොදුවේ ෆූකෝට විවේචන එල්ල වන නමුත්, සත්‍ය-දැනුම-බලය අතර යම් සම්බන්ධතාවක් තාර්කික ව විශ්ලේෂණයට ගත් උත්සාහය අමතක කළ නොහැකි ය. එසේ ම, ඒකාකෘතික වශයෙන් පැවති සාර්ව සමාජ විශ්ලේෂණයත්, සමස්තිකරණයත් නිසියාකාර ව විවේචනයට හසු කරගනිමින් ක්ෂුද්‍ර තලයෙන් සමාජය විනිවිද දැකීමට බලය-දැනුම සාකච්ඡාව උපයුක්ත කරගැනීමේ සාර්ථක බව වර්තමානය වන විටත් ඔහුගේ ශාස්ත්‍රීය රචනා පිළිබඳ අවධානය යොමු වීම තුළින් පැහැදිලි කරවයි. එබැවින් බුද්ධිමය තලයේ විවේචන පැවතිය ද මිචෙල් ෆූකෝගේ බලය-දැනුම සංකල්පයේ විග්‍රහාත්මක දායකත්වය ශාස්ත්‍රීය තලයේ තත්කාලීන වැදගත්කමක් උසුලන බව කිව හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

උයන්ගොඩ, ජේ. (1988). *මිෂෙල් ෆූකෝගේ විධික්‍රමය පිළිබඳ කෙටි හැඳින්වීමක්.* සමාජ විග්‍රහ. පළමු කලාපය. පේරාදෙණිය: සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව.

ද සිල්වා පී. සහ අත්තනායක ඒ. (2016). *නූතනත්වය, පශ්චාත් නූතනවාදය සහ නව සමාජ විද්‍යාත්මකන්‍යායන්.* (එස්. එල්. දෝෂිගේ ග්‍රන්ථයේ පරිවර්තනය සහ සංස්කරණය) කොළඹ: ෆාස්ට්ප්‍රින්ට් පෞද්ගලික සමාගම.

දෝෂි, එස්. එල්. (2008). *පශ්චාත් නූතනවාදය යනු කුමක්ද?.* ප්‍රවාද. කලාප අංක 28. කොළඹ: සමාජවිද්‍යාඥයින්ගේ සංගමය.

පිණිකහන, ජේ. (2014). *වෛද්‍ය සමාජ විද්‍යාව.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

පෙරේරා, බී. ඒ. (2011). *සමාජ විද්‍යාව-සමාජය හා සංස්කෘතිය.* කඩවත: නුවණි ප්‍රකාශකයෝ.

Beck, U. and Beck, E. (2002). *Individualization: Institutionalized Individualism and its Social and Political Consequences*. Published in association with Theory, Culture & Society. US: SAGE Publications. Retrieved from: https://books.google.lk/books?id=3tXOU70_qagC [Accessed on: 1st May, 2019].

Berger, P. and Luckmann, T. (1966). *The Social Construction of Reality: A Treatise in the Sociology of Knowledge*. England: Penguin Books.

Birkmann, J., Feldmeyer, D. and Welle, T. (2017). *Development of Human Vulnerability 2012 –2 17*. German: Journal of Extreme Events. Retrieved from: https://doi.org/10.1142/s2345737500057 [Accessed on: 25th May, 2018].

Bruchell, G. (1966). *"Liberal Government and techniques of Self", in A. Berry, T. Osborne and N.Rose (ed.s). Foucault and Political Reason: Liberalism, Neo Liberalism and Rationalities of the Government*. London: UCC Press.

Crampton, J.W. and Elden, S. eds., (2007). *Space, knowledge and power: Foucault and geography*.Ashgate Publishing, Ltd.

Edmonds, J. S. (2011). *Criticism without Critique: Power and Experience in Foucault and James*. Foucault Studies, No. 11. CBS open journal. US: Vanderbilt University. Retrieved from: https://rauli.cbs.dk/index.php/foucault-studies/article/3204 [Accessed on: 04th May, 2019]

Ernst, A. B. (2016). *Beyond Foucault: New perspectives on Bentham's Panopticon*. London: Routledge.

Escobar, A. (1984). Discourse and Power in Development: Michel Foucault and the Relevance of HisWork to the Third World. *Alternatives*, 10(3), 377–400. https://doi.org/10.1177/030437548401000304 [Accessed on: 11th of March, 2020).

Foucault, M. (1972). *"The Discourse in Language" in the Archelogy of Knowledge and the Discourseon Language*. Translated by A. M. Sheridan Smith. New York: Pantheon.

Foucault, M. (1979). *"Truth and Power", in working papers, (ed.). Meaghan Morris and Paul Patton.*Sydney: Ferral Publication.

Foucault, M. (1980). *"Method" from History of Sexuality: Volume 01: An Introduction.* Translated byRobert Hurley. New York: Vintage.

Foucault, M. (1980b). *"Two Lectures" in (Gordon ed.). Power Knowledge: Selected interviews and otherwritings: 1972-1977*. Hemel Hampstead: Harvester Wheatsheald.

Foucault, M. (1983). *"Afterward: the subject and power" in H. Dreyfus and P. Rainbow (eds.)., MichelFoucault: Beyond Structuralism and Hermeneutics*. Chicago: Chicago University Press.

Foucault, M. (1990). *Law, Power and Knowledge General Turkel*. Journal of Law and Society. Vol. 2.Pondicherry: Wiley Publishers. Retrieved from: https://www.jstore.org/stable/1410084 [Accessed on: 05th May, 2019].

Foucault, M. (1992). *The Forth Face of Power*. *In Journal of Politics by Peter Digeser*. Chicago:University of Chicago Press.

Foucault, M. (1996). *"How Much Does it Cost for Reason to Tell the Truth", in S. Lotringer (ed.),Foucault Live: Collected Interviews, 1961-1984.* New York: Semiotext.

Foucault, M. (2002). *Archaeology of Knowledge (2nd ed.)*. London: Routledge. Retrieved from:https://doi.org/10.4324/9780203604168 (Accessed on: 13th of March, 2022).

Foucault, M. (2003). *Society must be defined*. London: Penguil Allen Lane.

Foucault, M. and Rainbow, P. (ed.). (1991)*"Chapter 19: Space, Knowledge and Power" from TheFoucault reader*. London: Penguin.

Foucoult, M. (1975). *Discipline and punish*. *A. Sheridan, Tr., Paris, FR, Gallimard*.

Gallagher, M. (2008). *Foucault, Power and Participation*. International Journal of Children's Rights.Leiden: Martinus Nijhoff Publishers.

Habermas, J. (1987). *The Philosophical Discourse of Modernity*. Tr. by Frederick Lawrence. Cambridge: The MIT Press.

Legg, S. (2011). *Assemblage/apparatus: using Deleuze and Foucault*. *Area*, *43*(2), 128-133.

Martin, B. (1982). *Feminism, Criticism and Foucault*. Durham: Duke University Press.

Poster, M. (1989). *Critical Theory and Poststrualism: In search of a context*. London: CornellUniversity.

Power, M. (2011). *Foucault and Sociology*. Annual Review of Sociology. Vol. 37. Retrieved from:https://www.jstore.org/stable/4125598 [Accessed on: 8th March, 2019].

Preda, A. (2001).Postmodernism in sociology. *In International Encyclopedia of the Social & Behavioral Sciences*: Second Edition (pp. 676-679). Elsevier Inc.

Ranke, K. (2014).*Foucault's Discourse and Power/Knowledge theories as a basis of augmentation inArturo Escobar's Development as a Discourse Theory*. Berlin: Global Studies Programme.

Simon, J. (1994). *Between Power and Knowledge: Habermas, Foucault, and the Future of LegalStudies*. California: Berkeley Law Scholarship Repository. Retrieved from:https://scholarship.law.berkeley.edu/facpubs [Accessed on: 10th May, 2019].

Szeman I. and Kaposy, T.( 2011).*Cultural Theory: An Anthropology*. Pondicherry: Weiley Blackwell.

Woermann, M. (2012). *Interpreting Foucault: an evaluation of a Foucauldian critique of education.South African Journal of Education*. South Africa: University of Pretoria.

Wood, D. (1988). *Derrida and DIFFÉRANCE*. (Ed. Bernasconi, R.). Evanston: Northwestern University Press.